වාර්ෂික වාර්තාව 2010

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

www.condominium.lk

වාර්ෂික වාර්තාව
2010

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
1 වන මහල , ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල
සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත
කොළඹ 02
දු.ක : 2 447429/2 447432 ෆැක්ස් : 2 423606
ඊ මේල් : cmastaff@sltnet.lk

www.condominium.lk

දැක්ම

රටේ නිවාස අවශ්‍යතාවය සඳහා විසඳුමක් ලෙස සහාධිපත්‍ය ජනාවාස.

මෙහෙවර

සහාධිපත්‍ය දේපලවල, පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය හා සුභ සාධනයට ගැලපෙන පරිදි ඉදිකිරීම සහ එම දේපල ක්‍රමවත්ව පාලනය හා කළමනාකරණය කිරීම සඳහා කළමනාකරණ සංස්ථා පිහිටුවා එම දේපල නඩත්තු කරවීම යන කාර්යයන් නියාමනය කිරීම.

1

පාලන වාර්තාව

- පාලන වාර්තාව
- අධිකාරියේ අරමුණු
- අධිකාරියේ බලතල
- සමස්ථ ක්‍රියාකාරිත්වය
- සහතිකපත් නිකුත්කිරීම
- කළමනාකරණ සංස්ථා පිහිටුවීම හා සක්‍රිය කිරීම
- සභාධිපත්‍ය දේපළ ආරවුල් විසදීම
- සභාධිපත්‍ය දේපළ පිළිබඳ දැනුවත් කිරීම
- බද්ධ නිවාස අයිතිකම් පනත සංශෝධනය
- මෙහෙයුම් හා නඩත්තු කටයුතු
- මානව සම්පත් කළමනාකරණය
- සමස්ථ සමාලෝචනය
- සංවර්ධන කටයුතු
- ඇගයීම

2

ගිණුම් හා මූල්‍ය වාර්තාව

- මූල්‍ය ප්‍රකාශය
- ඒකාබද්ධ මූල්‍ය වාර්තාව
- ගිණුම් සඳහා සටහන්
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය

3

විගණකාධිපති වාර්තාව

ආයතනික තොරතුරු

ආයතනය

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සංස්ථාපනය

2003 නොවැම්බර් 10

1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල පනත
2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධිත) පනත

කාර්යාල ලිපිනය

1වන මහල , ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත
කොළඹ 02

දුරකථන / ෆැක්ස්

2447429 / 2447432
2423606

ඊමේල්

cmastaff@sltnet.lk , it@condominium.lk

වෙබ් අඩවිය

www.condominium.lk

අධ්‍යක්ෂ මණ්ඩලය

01 නීතිඥ කපිල ගමගේ මහතා
සභාපති
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

02 පී.යූ .උපවංශ මහතා
සාමාන්‍යාධිකාරී
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

03 චාන්දනී විජයවර්ධන මහත්මිය
අධ්‍යක්ෂිකා
ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය (භාණ්ඩාගාර නියෝජිත)

04 නිහාල් ප්‍රනාන්දු මහතා
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
නාගරික සංවර්ධන අධිකාරිය

05 කේ.එල්.එල්.ප්‍රේමනාත් මහතා
සාමාන්‍යාධිකාරී ,
ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය

06 බ්‍රිගේඩියර් ඒ.එල්.එස්.කේ.පෙරේරා මහතා
සාමාන්‍යාධිකාරී
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

07 දමිත කුමාරසිංහ මහතා
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

08 හදානි ජයවර්ධන මහත්මිය
නාගරික කොමසාරිස්
කොළඹ මහ නගර සභාව

09 ශාන්තා පී ලියනගේ මහත්මිය
නාගරික කොමසාරිස්
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

10 කේ.ඩී.ඩබ්.ධම්මික නාමල් මුතුගල මහතා
නාගරික කොමසාරිස්
දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

11 එච්.එන්.එස්.අංගම්මන මහත්මිය
නාගරික කොමසාරිස්
මොරටුව මහ නගර සභාව

ආයතනික සැලැස්ම
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය



පාලන වාර්තාව 2010

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවනු ලැබුවේ 1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල පනත සංශෝධනය කරමින් ඉදිරිපත් කරනු ලැබූ 2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතිනි . එම පනතේ 2 වන වගන්තිය අනුව *"සහාධිපත්‍ය දේපළ , අර්ධ සහාධිපත්‍ය දේපළ සහ තාවකාලික සහාධිපත්‍ය දේපල වල පාලනය , කළමනාකරණය , ඒවා නඩත්තු කරවීම සහ පරිපාලනය කිරීම සඳහා සහාධිපත්‍ය දේපළ කළමනාකරණය අධිකාරිය පිහිටුවන "* බව සඳහන් කර ඇත. ඒ අනුව 2003 නොවැම්බර් 10 දින සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සංස්ථාපිත කරන ලදී

02 අධිකාරියේ අරමුණු

ඉහත කී සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරි පනතේ 5 වන වගන්තිය අනුව අධිකාරියේ අරමුණු පහත පරිදි දැක්විය හැක .

(අ) සභාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සභාධිපත්‍ය දේපළවල සභාධිපත්‍ය කොටස් , සභාධිපත්‍ය අංගෝපාංග සහ පොදු පහසුකම් පාලනය කිරීම , කළමනාකරණය කිරීම නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම ,

(ආ) සභාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සභාධිපත්‍ය දේපළවල පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් නිසි ආකාරයට හොඳින් නඩත්තු කරන බවට සහතික වීම සහ ඒ දේපළ මනා තත්වයෙන් සහ සේවයට යොදවාගත හැකි අන්දමින් සහ නිසි ආකාරයෙන් නඩත්තු කිරීම සඳහා කලින් කල අළුත්වැඩියා කිරීම් කරන බවට සහතික වීම සහ ඒ ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ සංස්ථාවට හෝ අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන් සහයවීම හෝ නැතහොත් ඒ ක්‍රියාවන් කියාත්මක කිරීම කළමනාකරණ සංස්ථාව හෝ අයිතිකරු හෝ අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් හෝ පැහැර හරින අවස්ථාවකදී ඒ ක්‍රියාවලට සෘජුවම මැදිහත්වීම .

ඇ) ගින්නෙන් , මහජන කැළඹීම්වලින් සහ කැරලි කෝලහලවලින් වන උපද්‍රව වලට එරෙහිව සභාධිපත්‍ය කොටස් සංයුක්ත වන සියළු ගොඩනැගිලි රක්ෂණය කිරීමට හෝ රක්ෂණය වලංගුව තබා ගන්නා ලෙස කළමනාකරණ සංස්ථාව විසින් හෝ අයිතිකරුවන් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් එසේ කරන බවට සහතික වීම සහ ඒ සඳහා වූ වාරික හෝ වෙනත් ගාස්තු අවස්ථානෝචිත පරිදි කළමනාකරණ සංස්ථාවෙන් හෝ අයිතිකරුගෙන් ආපසු අයකර ගැනීම ;

(ඈ) සභාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි සභාධිපත්‍ය පිඹුරට හෝ අර්ධ සභාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි අර්ධ සභාධිපත්‍ය පිඹුරට පටහැනිව අදාළ අයිතිකරුවන් හෝ සභාධිපත්‍ය කොටස්වල පදිංචිකරුවන් හෝ වෙනත් තැනැත්තෙකු විසින් ඉදිකරන ලද හෝ සිදුකර ඇති සියළු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම ;

(ඉ) සභාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළේ කළමනාකරණ සංස්ථාව නිසි ආකාරයෙන් ක්‍රියාකරන බවට වගබලා ගැනීම සහ ඒ කළමනාකරණ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම ;

(ඊ) සභාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළේ සභාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාවට හෝ අයිතිකරුට හෝ අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට ජලය , කසළ, කාණු , ජලාපවාහනය , ගෑස් විදුලිය , කුණු කසළ බැහැර කිරීම , වායු සමීකරණය , දුරකථන , ගුවන්විදුලි සහ රෙඩිපියුෂන් වැනි සේවා ලබා දීමේදී ඒ අයිතිකරුට , අයිතිකරුවන්ට , පදිංචිකරුවන්ට සහයවීම ;

(උ) සභාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ග ප්‍රවේශයන් , තණ පිට්ටනි , වතු උද්‍යාන , ක්‍රීඩාංගන සහ වෙනත් එළිමහන් ස්ථාන පිහිටුවා නඩත්තු කිරීමට සහයවීම හෝ එවැනි පහසුකම් පිහිටුවීම සහ නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම ;

(ඌ) සභාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සභාධිපත්‍ය දේපළවල සභාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාවේ හෝ ඒවායේ අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ඉල්ලීම පරිදි ඒ සභාධිපත්‍ය කොටස් නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීමේ සේවා සැපයුම ;

(එ) පලුදු දරන්නන්ගේ අයිතින් ආරක්ෂාවීම සහතිකවීම සඳහා ලියාපදිංචි තාවකාලික සභාධිපත්‍ය දේපළ තැනීමේ ප්‍රගතිය නියාමනය කිරීම සහ ඒ අයිතීන් ආරක්ෂා කිරීමට අවශ්‍ය කවර හෝ අවස්ථාවකදී ඊට මැදිහත්වීම ;

(ඒ) රජය විසින් අනුමත කිරීම සඳහා ප්‍රාග්ධන ආයෝජන සැලසුම් ඇතුළු සහාධිපත්‍ය දේපළ නැවත සංවර්ධනය කිරීම් වැඩසටහන් සකස් කිරීම සහ අනුමැතිය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඔ) රජය විසින් අනුමත කරනු ලබන වැඩ සටහන්වලින් සහාධිපත්‍ය දේපළ නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භාරගැනීමට හෝ ඒ ව්‍යාපෘති ක්‍රියාවේ යෙදවීමට භාර ගැනීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් හෝ නිවාස සංවර්ධන අධිකාරියකින් හෝ පලාත් පාලන ආයතනයකින් හෝ රජයේ යම් නියෝජිත ආයතනයකින් හෝ පෞද්ගලික සංවර්ධනකරුවෙකුගෙන් ඉල්ලා සිටීම ;

(ඕ) යම් ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක දැක්වෙන යම් සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් අයිතිකරු විසින් අවසන් කිරීම පැහැර හැරීමේදී එය අවසන් කිරීමට භාර ගැනීම සහ

(ක) අධිකාරියේ අරමුණුවලින් යම් අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හෝ නැවත සංවර්ධනය කිරීම ;

(බ) ඉහත සඳහන් අරමුණු සියල්ලම හෝ ඉන් යම් අරමුණක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ අහිතකර වන වෙනත් සියළු දේ කිරීම .

ඉහත කී අරමුණු ඉටුකිරීම සඳහා පනතේ 06 වන වගන්තියෙන් අධිකාරියට බලතල රාශියක් ලබාදී ඇති අතර ඒවා පහත සඳහන් පරිදි දැක්විය හැක .

2.1 අධිකාරයේ බලතල

- සහාධිපත්‍ය දේපලේ කළමනාකරණ සංස්ථාව සහ එහි අයිතිකරු අතර , අයිතිකරු හෝ පදිංචිකරු අතර , අයිතිකරු හෝ මිලදී ගත් තැනැත්තා අතර ඇතිවන ආරවුල් විසදීම .

- තාවකාලික සහාධිපත්‍ය දේපළක ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා හෝ ඕනෑම සහාධිපත්‍ය දේපළක පොදු අංගෝපාංග නඩත්තු නොකිරීම හෝ අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම සඳහා හෝ පරීක්ෂා කිරීම හෝ එම දේපළට ඇතුළුවීම .

- අධිකාරිය විසින් සපයනු ලබන සේවා සඳහා ගාස්තු අයකර ගැනීම

- සහාධිපත්‍ය දේපළ කොටස්වල පොදු පහසුකම් වලට හෝ පොදු අංගෝපාංගවලට අයිතිකරු හෝ යම් තැනැත්තෙකු විසින් සිදුකරන ලද යම් හානියක් යථා තත්වයට ගෙන ඒම සඳහා දරණ ලද වියදම් ඒ තැනැත්තාගෙන් අයකර ගැනීම .

3. 2010 වර්ෂයේ අධිකාරියේ සමස්ථ ක්‍රියාකාරීත්වය

සහාධිපත්‍ය දේපල නියාමනය කිරීමේ ආයතනය ලෙස අධිකාරිය සතු සීමිත සම්පත් සහ බලතල පදනම් කරගෙන කාර්‍යක්ෂම සේවාවක් කිරීමට සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියට හැකියාව ලැබුණි .

එහෙත් අධිකාරියට පාලනය කළ නොහැකි හේතුන් රාශියක් තිබුනද 2009 වර්ෂය හා සසඳන කළ ආදායම් තත්වයේ වර්ධනයක් දක්නට ඇත. 2009 වර්ෂයේදී පිරිවැටුම රු.මිලියන 38.630 ක් වූ අතර 2010 වර්ෂයේ දී එය මිලියන 57.823 දක්වා වර්ධනයක් දක්නට ඇත. අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය සහතික ආදායම වන අතර , 2010 වර්ෂයේදී රු.මි. 46.4 ක් සහතික පත් ආදායම් ලෙසට සමස්ථ පිරිවැටුමට එකතු කරන ලද බව සඳහන් කළ යුතුය .

අදාල කාලය තුල සමස්ථ වියදම රු.මිලියන 57.780 ක් වූ අතර , 2009 වර්ෂයේදී වියදම රු.මිලියන 55.397 ක් විය . 2009 වර්ෂයේදී ශුද්ධ ඌනතාවය රු.මිලියන 16.768 ක් වූ අතර , 2010 වර්ෂයේ දී ශුද්ධ අතිරික්තය රු.මිලියන 0.027 ක් විය .

අධිකාරිය පසුගිය වර්ෂයට සාපේක්ෂව ලාභදායී තත්වයකට පත්වූයේ , සහාධිපත්‍ය දේපළ ක්ෂෙත්‍රයේ පහත සඳහන් ගැටළුකාරී තත්වයන් පවතිමින් තිබියදී බව මෙහිලා සඳහන් කළ යුතුය .

- 2009 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දේපළ සමාගම්වල මූල්‍ය කළමනාකරණය පිළිබඳව ඉල්ලුම්කරුවන්ගේ විශ්වාසය බිඳවැටීම දිගටම පැවතීම .

- බැංකු හා ණයදෙන මූල්‍ය සමාගම් සහාධිපත්‍ය දේපළ සඳහා ණය ලබාදීම සීමා කිරීම .

- බොහෝ ඉදිකිරීම් සමාගම් , නාගරික නිවාස ඉල්ලුම නිවැරදිව තක්සේරු නොකිරීම නිසා , අධි සුඛෝපභෝගී ඉදිකිරීම් වලට යොමුවීම .

මෙම හේතු නිසා සහාධිපත්‍ය දේපළ ඉදිකරණ සමාගම් අර්බුද රැසකට මුහුණ දෙන ලදී . එම නිසා අධිසුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී විශාල ඉදිකිරීම් ප්‍රමාණය අඩු වූ අතර , සහාධිපත්‍ය සහතිකය ලබා ගැනීමේ ඉල්ලුම සම්පූර්ණයෙන්ම පාහේ පහත වැටුණි .
2010 වර්ෂයේ සහතික ලබාදුන් සංඛ්‍යාව 66 ක් වූ නමුත් ඒකක 10කට වැඩි දේපළ සඳහා සහතික ලබා ගැනීමට ඉදිරිපත් වූ ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව 24 ක් විය .මෙය මුළු ඉල්ලුම් පත් සංඛ්‍යාවෙන් 36% කි .

3.1 සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම

2003 අංක 39 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත අනුව තාවකාලික සහාධිපත්‍ය දේපළ , අර්ධ සහාධිපත්‍ය දේපළ හා සම්පූර්ණ කරන ලද සහාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් නියාමන වගකීම් පවරා ඇත. ඒ අනුව සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය හා සුභසාධනය සඳහා සපයා ඇති පොදු පහසුකම් පිළිබඳව සෑහීමකට පත්විය හැකි බවට හා පොදු අංගෝපාංග පාලනය හා කළමණාකරණය සඳහා යොදා ඇති වැඩපිළිවෙළ පිළිබඳව සෑහීමකට පත්විය හැකි බවට තහවුරු කරමින් ගොඩනැගිලි සංවර්ධකයින් වෙත සහතිකයක් ලබාදිය යුතු බවට අනිවාර්ය කර ඇත. මෙම සහතික ලබාදීමට ප්‍රථම අධිකාරිය විසින් අදාල ලියවිලි පරීක්ෂා කිරීම සහ ඉංජිනේරු සහකාරවරු මගින් අදාල ගොඩනැගිලි අනුමත සැළසුමට අනුව ඉදිකර ඇති බවට පරීක්ෂා කරන අතර , අවසානයේදී වාස්තු විද්‍යාඥයින්, ව්‍යුහ ඉංජිනේරු , පළාත් පාලන ආයතන නිළධාරින් , ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව , ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වැනි ආයතනවල වෘත්තිය සුදුසුකම් ලත් නිළධාරින්ගෙන් සමන්විත කමිටුවක නිර්දේශ ලබාගෙන සහතික ලබාදීම කරනු ලබයි .

එම සහතිකය දේපළ සංවර්ධකයාට පහත අවස්ථාවලදී ලබා ගත හැක .

(අ) සැළසුම් අනුමැතිය ලබාගැනීමෙන් පසු ඉදිකිරීමට යෝජිත දේපළක් සඳහා තාවකාලික සහාධිපත්‍ය සහතිකය .

(ආ) ඉහත ලෙස අනුමැතිය ලත් ගොඩනැගිල්ලක අර්ධයක් පදිංචිය සඳහා යෝග්‍ය බවට අනුකූලතා සහතිකය ලබාගැනීමෙන් පසු , ඒ සඳහා නිකුත් කරනු ලබන අර්ධ සහාධිපත්‍ය සහතිකය

(ඇ) ගොඩනැගිල්ලක සම්පූර්ණයෙන් නිම කිරීමෙන් පසු නිකුත් කරනු ලබන සහාධිපත්‍ය සහතිකය .

සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම 2005-2010						
	2005	2006	2007	2008	2009	2010
තාවකාලික සහාධිපත්‍ය සහතික	-	04	11	04	05	01
අර්ධ සහාධිපත්‍ය සහතික	-	03	02	03	02	03
සම්පූර්ණ සහාධිපත්‍ය සහතික	12	81	92	94	112	62
	12	88	105	101	119	66

2009 වර්ෂයේ සහතිකවලින් ලැබූ ආදායම රු.මිලියන 23.6 ක් වූ අතර , 2010 වර්ෂයේදී එය රු.මිලියන 46.4 ක් විය . 2009 වර්ෂයේදී ලබාදුන් සහතික ප්‍රමාණය වැඩි ඇති නමුත් ආදායම් පහත වැටීමට හේතු වූයේ ඉදිරිපත් වූ සහතික අයදුම්පත් අඩු ඒකක ප්‍රමාණයන්ගෙන් යුත් ගොඩනැගිලි සඳහා වීමය .

3.2 කළමනාකරණ සංස්ථා පිහිටුවීම හා සක්‍රිය කිරීම

* ඉදිකරන ලද සහාධිපත්‍ය දේපලේ සහාධිපත්‍ය පිඹුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කිරීමත් සමඟ එම දේපලේ කළමනාකරණ සංස්ථාව නිත්‍යානුකූලව ඇති වේ . එවැනි දේපලක ලියාපදිංචි කර මාස 06 ක් ඇතුළත එම කළමනාකරණ සංස්ථාවේ ප්‍රථම රැස්වීම සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙන් කැඳවිය යුතුය . සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නිළධාරීන් නිරන්තරයෙන්ම කළමනාකරණ සංස්ථා පිහිටුවීම සහ ඒවායේ වාර්ෂික සහා රැස්වීම්වලට සහභාගි වේ. 2009.12.31 දිනට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ලියාපදිංචි කරන ලද සංස්ථා ගණන 197 ක් වේ . 2010 දෙසැම්බර් 31 දිනට එය 235 ක් විය .

* එයට අමතරව සුනාමි ප්‍රදේශවල ඉදිකරන ලද සහාධිපත්‍ය දේපළවල සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීම හා හිමිකම් ඔප්පු ලබාදීම් ක්‍රියාවලිය ප්‍රමාද වන බැවින් ඒවායේ පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග කළමනාකරණය සහ පරිපාලනය සඳහා කළමනාකරණ සංස්ථාව නිත්‍යානුකූලව පිහිටුවන තෙක් , කළමනාකරණ කමිටු පිහිටුවීමට අධිකාරිය විසින් පියවර ගෙන ඇත. ඒ අනුව මේ වන විට එවැනි සහාධිපත්‍ය දේපළ 35 ක කළමනාකරණ කමිටු පිහිටුවා ඇත.

* එමෙන්ම මෙතෙක් රජයේ සහ පෞද්ගලික අංශයෙන් ඉදිකරන ලද සහාධිපත්‍ය දේපළවල සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි නොකිරීම නිසා හෝ ඔප්පු ලබා නොගැනීම නිසා හෝ කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නොහැකි දේපළ වල කළමනාකරණ කමිටු පිහිටුවීමට 2009 වර්ෂයේ සිට කටයුතු කරන ලදී . එහෙත් 2005 සිට 2009 වර්ෂය දක්වා ලබාගත හැකි වූයේ ඉතාම අවම ප්‍රථිපලයකි . එනම් රාජ්‍ය අංශයේ කළමනාකරණ කමිටු 11 ක් සහ පෞද්ගලික අංශයේ කළමනාකරණ කමිටු 35 ක් වශයෙන් වර්ෂ 5 ක කාලය තුළ කමිටු 46 ක් පමණක් පිහිටුවා ඇත. එහෙත් 2010 වර්ෂයේදී පමණක් කළමනාකරණ කමිටු 15 ක් පිහිටුවීමට හැකියාව ලැබී ඇත.

කළමනාකරණ සංස්ථා පිහිටුවීමේදී මෙම වර්ෂයේදී ද පහත සඳහන් දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු විය

* දේපළ අයිතිකරුවන්ගේ දේපළ නඩත්තුව සඳහා කළමනාකරණ සංස්ථාවේ වැදගත්කම පිළිබඳ අනවබෝධය .

* රාජ්‍ය ආයතන විසින් ඉදිකරන ලද මහල් නිවාස ක්‍රමවල පදිංචිකරුවන් කළමනාකරණ සංස්ථා පිහිටුවීම සම්බන්ධයෙන් උනන්දුවක් නොදැක්වීම .

* පෞද්ගලික ආයතන විසින් ඉදිකරනු ලබන බොහෝ දේපළවල අයිතිකරුවන් ස්ථිර ලෙස ඒවායේ පදිංචි නොවීම .

* මේවායේ පදිංචිකරුවන් කාර්ය බහුලවීම නිසා හෝ , ස්වේච්ඡා පදනමක් යටතේ නඩත්තුව හා කළමනාකරණ කටයුතුවලට සම්බන්ධ වීමට දක්වන මැලිකම .

* නඩත්තු මුදල් ගෙවීම පැහැර හැරීම හා කළමනාකරණ සංස්ථාවේ නිළධාරි මණ්ඩලයට අනෙක් පදිංචිකරුවන් සහාය නොදැක්වීම .

3.3 සහාධිපත්‍ය දේපළවල ආරවුල් විසඳීම

3.3 සහාධිපත්‍ය දේපළවල ආරවුල් විසඳීම

සහාධිපත්‍ය දේපලේ කළමනාකරණය සහ එහි සංස්ථා අයිතිකරු , අයිතිකරු හෝ පදිංචිකරු අතර , අයිතිකරු හෝ මිළදී ගත් තැනත්තා අතර , ඇතිවන ආරවුල් විසඳීම සඳහා මැදිහත්ව කටයුතු කිරීමට අධිකාරියට බලතල ලබාදී ඇත. ඒ අනුව දැනට එම ආරවුල් විසඳීම සඳහා පරීක්ෂණ සභාවක් පිහිටුවා ඇත. එම පරීක්ෂණ සභාව වෙත 2009 වර්ෂයේදී ඉදිරිපත් වූ පැමිණිලි ස්වරූපය අනුව පහත දැක්වෙන ලෙස වර්ග කල හැක .

- ගොඩනැගිල්ල ඉදිකර අළෙවි ගිවිසුමකින් විකුණා වසර 05 කට අධික කාලයක් ගතවී ඇතත් , සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කල නොහැකි නිසා පදිංචිකරුවන්ට ඔප්පු ලබා නොදීම .

- අනුමත කරන ලද ගොඩනැගිලි සැළසුමට පටහැනිව ඉදිකිරීම් කිරීම . සමහර දේපළ සංවර්ධකයින් මහල් කිහිපයක් අනුමත කරගෙන තවත් මහල් කිහිපයක් ඉදිකර විකිණීම නිසා අනුකූලතා සහතිකය ලබාගත නොහැකි වීම .

- පොදු අංගෝපාංග හා පොදු පහසුකම් අනුමත සැලැස්මට අනුකූලව ලබා නොදීම .

- පදිංචිකරුවන් කළමනාකරණ සංස්ථාවට මාසික නඩත්තු මුදල් නොගෙවීම

- අනවසර ඉදිකිරීම් සිදුකිරීම .

මෙවැනි පැමිණිලි 120 කට අධික ප්‍රමාණයකට 2010 වර්ෂයේදී අධිකාරිය විසඳුම් ලබාදී ඇති අතර , සමහර පැමිණිලි විභාග වෙමින් පවතී . ඉහත ක්‍රියාකාරීත්වයන් තුලින් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පසුගිය වසර 05 තුලදී අධිකාරිය පිහිටුවීමට හේතුවූ පරමාර්ථ ඉටුකිරීම සඳහා මැනැවින් දායකත්වය සපයා ඇති බව සඳහන් කළ හැකිය

3.4 සහාධිපත්‍ය දේපළ පිළිබඳ දැනුවත් කිරීම

සහාධිපත්‍ය දේපළ නීතිය , සැළසුම්කරණය , නඩත්තුව හා කළමනාකරණය පිළිබඳ අදාල ක්ෂේත්‍රයන් දැනුවත් කිරීම සඳහා අප සමාලෝචිත වර්ෂය තුලදී පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

- ත්‍රෛයිමාසිකව ප්‍රකාශයට පත්කරනු ලබන සහාධිපත්‍ය සඟරාව නිකුත් කිරීම .

- දැයට කිරුළ , ලෝක ජනාවාස දිනය පදනම් කරගනිමින් පවත්වනු ලබන තුන්කල් දැක්ම ඇතුළු රාජ්‍ය ප්‍රදර්ශන ආදියට සහභාගි වෙමින් ක්ෂෙත්‍රයට සම්බන්ධ පාර්ශවයන් සුනාමි සහාධිපත්‍ය දේපළවල පදිංචිකරුවන් සඳහා කළමනාකරණ සංස්ථා සංකල්පය සඳුන්වාදීම සහ එම ගිණුම් පවත්වාගෙන යෑම සම්බන්ධ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වීම .

3.5 බද්ධ නිවාස අයිතිකම් පනත සංශෝධනය

2003 සිට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ක්‍රියාත්මක වීමත් සමඟ එම පනතට අදාල සහාධිපත්‍ය දේපළවල ගැටළු විසඳා ගැනීම සඳහා බොහෝ දේපළ වල අයිතිකරුවන් ඉදිරිපත් විය .
එම කටයුතු කිරීමේදී සහාධිපත්‍ය දේපළ ලෙස නොසැළකෙන එහෙත් පොදු පහසුකම් රාශියකින් ද සමන්විත නිවාස ක්‍රම නඩත්තුව හා කළමනාකරණය පිළිබඳ නෛතික රාමුවක් නොමැති බවට තහවුරු වීම නිසා එම දේපළ සඳහා ද මෙම නීතිය අදාල කරගත හැකිවන ලෙස 1973 අංක 11 දරණ බද්ධ නිවාස පනත සංශෝධනය කිරීම සඳහා 2010 වර්ෂයේදී කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.
තවද පසුගිය වර්ෂ 08 තුළදී ක්ෂෙත්‍රයේ නියාමන වගකීම ඉටුකිරීමේදී , 1973 අංක 11 සහ 1973 අංක 10 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත හා පොදු පහසුකම් මණ්ඩල පනත යන පනත්වල හඳුනාගන්නා ලද අත්‍යාවශ්‍ය කරුණු ඇතුළත් කර මෙම පනත් සංශෝධනය කිරීමට මූලික කටයුතු ආරම්භ කිරීමට ද ක්‍රියාකරන ලදී .

3.6 මෙහෙයුම් සහ නඩත්තු කටයුතු

මීගමුව , ගම්පහ මූලික රෝහල්වල මළනාලිකා යන්ත්‍රාගාරවල නඩත්තු කටයුතු ද , මාදිවෙල මන්ත්‍රී නිල නිවාසවල නඩත්තු කටයුතුද අප අධිකාරියේ කාර්ය මණ්ඩලය යොදවා කරනු ලබයි . අතිරික්ත සේවක පිරිස යොදවා කරන ලද මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වලින් 2010 වර්ෂයේදී රු.මිලියන 6.8 ක් උපයන ලදී . එයට අමතරව විමධ්‍යගත අරමුදල් කොන්ත්‍රාත් කටයුතු මගින් රු.මිලියන 0.86 ක ආදායකම් ද උපයනු ලැබිය .

3.7 මානව සම්පත් කළමනාකරණ කටයුතු (සේවක සංඛ්‍යාව සහ ගැටළු)

2006/30 කළමනාකරණ සේවා චක්‍රලේඛය පදනම් කරගනිමින් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නව බඳවාගැනීම් පටිපාටිය සඳහා 2010 අප්‍රේල් මාසයේදී භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට හැකි විය . ඒ අනුව 2010 වර්ෂයේදී අධිකාරියට අඩුපාඩුවක්ව තිබූ විධායක ශ්‍රේණියේ තනතුරු කිහිපයක් සම්පූර්ණ කිරීමට හැකිවී ඇත.

එම නිසා 2009 වන විට මුළු කාර්ය මණ්ඩල සංයුතිය පහත දැක්වෙන පරිදි විය

සේවක සංඛ්‍යාව	
විධායක හා ජ්‍යෙෂ්ඨ වෘත්තීය නිලධාරීන්	18
කණිෂ්ඨ විධායක හා කළමනාකරණ සහකාර , පරිපාලක	26
පුහුණු හා නුපුහුණු වෘත්තිකයින්	29
නුපුහුණු (කාර්යාල සහායක ආදී)	19
එකතුව	92

3.8 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

2010 වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වා ඇත.

විගණක හා කළමනාකරණ රැස්වීම්

සමාලෝචිත වර්ෂයේ දී විගණක හා කළමනාකරණ රැස්වීම් 11 ක් පවත්වා ඇත.

3.9 සමස්ථ කාර්‍යපථයේ සමාලෝචනය

බොහෝ සේවා සැපයීම පාරිභෝගික පනතට අනුව සිදුකල යුතු නියාමන ක්‍රියාදාමයක් වන අතර ඒවායින් ආදායම් ලබාගත නොහැක . මෙම තත්වයත් තුල සමහර වියදම් පියවා ගැනීමට අපහසු සේවා සැපයීම් අත්හිටුවීමටද සිදුවී ඇත. සභාධිපත්‍ය දේපළ සඳහා නව රෙකුලාසි හඳුන්වා දීම , නැවත සංවර්ධනය කළහැකි දේපළ සඳහා ව්‍යාපෘති සැළසුම් සැකසීම , සභාධිපත්‍ය දේපළ සම්බන්ධ දත්ත ගබඩා කිරීම , අනවසර ඉදිකිරීම් සම්බන්ධ කටයුතු පනතේ ඇතැම් කරුණු වලට පටහැනිව ක්‍රියා කරන්නන්ට විරුද්ධව නීති මගින් කටයුතු කිරීම , කළමනාකරණ සංස්ථාවල අර්බුද විසඳීම හා ඒවා සක්‍රිය කිරීම වැනි අරමුණුවල සැළකිය යුතු ප්‍රගතියක් පෙන්වීමට 2010 වර්ෂයේදී හැකි විය .

3.10 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සංවර්ධන කටයුතු .

සභාධිපත්‍ය දේපළ කළමනාකරණය , නඩත්තුව , පාලනය , පරිපාලනය හා වෙනත් ක්ෂේත්‍රයන්ට අදාල සියළුම නියාමන කටයුතු සම්බන්ධයෙන් මහජන දැනුවත් කිරීම් සඳහා විශේෂ වැඩ පිළිවෙලක් ආයතනය විසින් ක්‍රියාත්මක කලේය . අදාල අංශවලට වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීමත් , දිගින් දිගටම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා සිදුකල දැනුවත් කිරීමත් හමුවේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත.

සභාධිපත්‍ය දේපළ සඳහා සහතික නිකුත් කිරීමේදී ද , ක්ෂෙත්‍රයේ අර්බුද හා ගැටළු විසඳීමේදීද , කළමනාකරණ සංස්ථා සක්‍රිය කිරීමේදී ද , විශේෂයෙන් ආයතනය ලබා ඇති ප්‍රගතිය සැළකිය යුතු මට්ටමක පවතී . සමාලෝචිත වර්ෂයේදී මෙම කටයුතු විධිමත් කිරීම සඳහා පාරිභොගික සේවා , සභාධිපත්‍ය සහතික අංශය සහ ඉංජිනේරු අංශය යන ප්‍රධාන අංශ වඩාත් කාර්‍යක්ෂම සේවාවන් සැපයිය හැකි පරිදි පුළුල් කිරීමට සහ සංවිධානය කිරීමට කටයුතු කරන ලදී .

තවද, කළමණාකරණ සංස්ථා හා සංවර්ධකයින් , පදිංචිකරුවන් හා සංවර්ධකයින් , කළමනාකරණ සංස්ථා හා පදිංචිකරුවන් යන පාර්ශව අතර ඇතිවන ගැටළු විසඳීම සඳහා සභාධිපත්‍ය අභියාචනා සභාවක් ඇති කර එම ගැටළු විසඳීම වඩා වේගවත් කිරීමට 2010 වර්ෂයේදී හැකිවිය .

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය , කොළඹ මහ නගර සභාව වැනි ආයතන වලින් ඉදිකරන ලද මහල් නිවාස ක්‍රමවල පදිංචි වී ඇත්තේ අඩු ආදායම්ලාභීන් වේ . දීර්ඝ කාලයක් බදු හෝ කුළී පදනම මත සිටීමට පුරුදු වුවත් , මෙම කාලසීමාව

තුලදී රාජ්‍ය ආයතන විසින් පොදු නඩත්තු කටයුතු හා අළුත්වැඩියා කටයුතු කර දීමත් නිසා දේපලේ අයිතිය ලබා ගැනීමෙන් පසුව ද එම දේපළ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ඒවායේ පදිංචිකරුවන් දක්වන්නේ මහත් උදාසීන භාවයකි . එම නිසා රාජ්‍ය අංශයේ කළමනාකරණ සංස්ථා ගොඩනැගීමේදී අධිකාරිය ලබා ගෙන ඇත්තේ ඉතාම අඩු ප්‍රගතියකි . දිගින් දිගටම රාජ්‍ය ආයතන ඉදිකරන ලද දේපළ වල කළමනාකරණ සංස්ථා පිහිටුවීම සඳහා ප්‍රචාරක හා දැනුවත් කිරීමේ කටයුතු කරනු ලැබීමද මෙම වර්ෂයේ දී ද සැළකිය යුතු ප්‍රගතියක් ඇති කර ගැනීමට නොහැකි වූ බව ද සඳහන් කළ යුතුය . එහෙත් මෙම තත්වය සම්බන්ධව රජයේ ඇඩි අවධානය යොමුකර මූල්‍ය ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම සඳහා මෙම අධිකාරිය යම් උත්සහයක් දරමින් පවති .

කෙසේ වුවද , මේ වනවිට අධිකාරිය රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහාධිපත්‍ය දේපළ සම්බන්ධ ක්ෂේත්‍ර තුල විශේෂයෙන්ම අත්‍යාවශ්‍ය කාර්‍යභාරයක් ඉටුකරන ආයතනයක් ලෙසට පත්වී ඇත.

ඇගයීම

නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ගරු ඇමතිනිය ලෙස කටයුතු කල ෆේරියල් අෂ්රොෆ් මැතිනිය , නිවාස අමාත්‍ය ගීතාංජන ගුණවර්ධන මැතිතුමා ඉදිකිරීම් , ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමත්‍ය ගරු විමල් වීරවංශ මැතිතුමා , හිටපු අමාත්‍යාංශ ලේකම් එස්.එම්.ඒ.එල්.ගුණතිලක මහතාද , ලේකම් ගෝඨාභය ජයරත්න මහතාද ඇතුළු අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ද , සමාලොචිත වර්ෂය තුලදී අප අධිකාරියට යහපත් මඟ පෙන්වීමක් ලබා දෙන ලදී . තවද , අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම සාමාජිකයින්ද , සියළුම පාරිභෝගිකයින්ද ආයතනයේ සියළුම සේවකයින්ද ලබාදුන් සහයෝගය පිළිබඳව ස්තූතිය පුදකරමි .

නීතිඥ කපිල ගමගේ	ජී.යූ.උපවංශ
සභාපති ,	සාමාන්‍යාධිකාරි ,
සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය	සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

.

මූල්‍ය ප්‍රකාශනය

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන්
අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය

ගිණුම් හා මූල්‍ය වාර්තාව

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශය (ශේෂ පත්‍රය)

2009 රු .	වත්කම්	සටහන 01		2010 රු .
	ජංගම නොවන වත්කම්			
	ස්ථාවර වත්කම්			
18,589,663	දේපළ , පිරියත් සහ උපකරණ	සටහන 01		14,507,617
	ආයෝජන			
5,995,530	දිගු කාලීන ආයෝජන හා කෙටිකාලීන ආයෝජන	සටහන 02		11,525,406
24,585,193				26,033,023
	ජංගම වත්කම්			
413,836	තොග	සටහන 03	481,654	
18,699,525	වෙළෙඳ ණයගැතියන් සහ සේවක ණය සහ ලැබිය යුතු ශේෂ	සටහන 04	22,351,712	
18,506	වෙනත් ලැබිය යුතු ශේෂ	සටහන 05	46,093	
280,603	ඉදිරියට කල ගෙවීම්	සටහන 06	81,684	
1,566,678	මුදල් සහ මූල්‍යමය අයිතම	සටහන 07	2,064,506	25,025,649
20,979,148				
45,564,341	මුළු වත්කම්			51,058,672
	වගකීම්			
	ජංගම වගකීම්			
3,958,340	ගෙවිය යුතු	සටහන 08	2,038,568	
2,050,757	උපචිත වියදම්		1,642,403	
31,012,187	ණයහිමියෝ / අත්තිකාරම්	සටහන 09	37,436,386	
21,412,213	ප්‍රතිපාදන	සටහන 10	22,783,178	
58,433,497	මුළු වගකීම්			63,900,535
(12,869,156)	ශුද්ධ වත්කම් එකතුව			(12,841,863)
	ශුද්ධ වත්කම් / නියෝජනය වන්නේ			
500,000	අනුදත් ප්‍රාග්ධනය			500,000
500,000	රජයේ ප්‍රාග්ධනය			500,000
2,500,000	ප්‍රසාද කොටස්			2,500,000
3,000,000				3,000,000
	එකතුව			
(37,135,282)	එකතු වූ අරමුදල්		(41,790,584)	
12,112,934	පෙර වසරට වෙනුවෙන් ගැලපුම්			
(41,790,584)	වර්ශය තුල අතිරික්තය (ඌණතාවය)		27,293	(41,763,291)
22,308,765	ප්‍රත්‍යාගණන සංචිතය			22,308,765
1,350,000	පොදු සංචිතය			1,350,000
2,262,663	ප්‍රාග්ධන මාරුකිරීම්			2,262,663
(12,869,156)	ශුද්ධ වත්කම් / හිමිකම් එකතුව			(12,841,863)

කපිල ගමගේ	ජී.යූ.උපවංශ	කේ.එච්.ජ්.උපාලි
සභාපති	සාමාන්‍යාධිකාරි	නි.සාමාන්‍යාධිකාරි (මුදල්) (වැ.බ)

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
2010 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා ඒකාබද්ධ
මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව

2009 රු.			2010 රු.
	ආදායම්		
33,457,137	මෙහෙයුම් ආදායම්	සටහන 11	56,454,482
5,173,083	මෙහෙයුම් නොවන ආදායම්	සටහන 12	1,368,786
38,630,220			57,823,268
	මෙහෙයුම් වියදම්		
38,286,951	සේවක වැටුප් හා දීමනා	සටහන 13	38,176,122
767,177	ගමන් වියදම්		677,516
2,812,695	සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය	සටහන 14	3,154,536
2,883,166	නඩත්තු වියදම්	සටහන 15	4,762,910
3,415,191	ව්‍යවස්ථාපිත වියදම්	සටහන 16	3,070,535
5,011,697	ක්ෂය වීම්		5,145,209
53,176,877	මුළු මෙහෙයුම් වියදම්		54,986,828
(14,546,657)	මෙහෙයුම් ක්‍රියාකාරකම් - අතිරික්තය (ඌණතාවය)		2,836,440
842,598	ව්‍යාපෘති වියදම් / සෘජු වියදම්	සටහන 17	591,860
1,018,952	මූල්‍ය වියදම්	සටහන 18	1,358,539
360,029	මෙහෙයුම් නොවන වියදම්		844,053
2,221,579	මුළු මෙහෙයුම් නොවන වියදම්		2,794,452
(16,768,236)	බදු අඩු කිරීමට පෙර ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)		41,988
	ආදායම් බදු සඳහා ප්‍රතිපාදන		14,695
(16,768,236)	ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)		27,293
(37,135,282)	පසුගිය වසරින් ඉදිරියට ගෙන ආ එකතු වූ අතිරික්තය / (ඌණතාවය)		(41,790,584)
(53,903,518)			(41,763,291)
	පෙර වර්ෂයට අදාල ගැලපුම්		
431,510	මුළු හර කිරීම්		-
12,544,444	මුළු බැර කිරීම්		-
(41,790,584)			(41,763,291)

ගිණුම් සඳහා සටහන්

(01) මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලවද යෝග්‍ය , ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම තුලින්ද අවස්ථානෝචිත පරිදි සාධාරණ හා ලෙස ගිණුම් කරණ ඇස්තමේන්තු සකස් කර ගනිමින් මෙම ගිණුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඇත . වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මනා අභ්‍යන්තර පාලනයක් සැලසුම් කිරීමෙන් එය ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම තුලින් සාධාරණ ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සහ පිළියෙල කිරීමට කටයුතු කර ඇති බවට සහතික වෙමු .

02. විගණන ප්‍රතිපත්ති
පිළිගත් ගණකාධිකරණ ප්‍රතිපත්තින්ට අනුකූලව අනොන්‍ය වශයෙන් කාල පරිච්ඡේද පිළිබඳව අන්තර් සම්බන්ධතාවයකින් යුක්තව ඓතිහාසික අය පදනම මත අධිකාරියේ ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රතිපත්ති වලට බලපෑ හැකි උද්ධමනකාරී සාධක අරභයා ගැලපුම් කිරීමක් කර හැකි වන අතර උපචිත පදනම මත ගිණුම් වාර්තා සකස් කර ඇත.

03. ස්ථාවර වත්කම්
ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන්කිරීමේදී අධිකාරියේ ප්‍රතිපත්තිය අනුව මිළදී ගත් දින සිට විකුණන දිනය දක්වා සරල මාර්ග ක්‍රමය පදනම් කර ගනිමින් ක්ෂය වෙන් කිරීම සිදුකෙරේ .

මෝටර් වාහන	25%
කාර්‍යාලීය ලීබඩු හා උපාංග	20%
යන්ත්‍රෝපකරණ සහ උපකරණ	20%
කාර්‍යාල උපකරණ	20%
ගොඩනැගිලි	4%

04. පාරිතෝෂික
අවම වශයෙන් වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික ගෙවියයුතු වටිනාකම සඳහා ගිණුම්වල වෙන් කිරීම් කරනු ලැබ ඇත. 2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂයට අදාල එම වටිනාකම රු.17,282,147.50 ක් වේ .

05.තොග
තොග මිළදී ගැනුම් පිරිවැය මත ආගණනය කර ගිණුම්වල ගැලපීම කර ඇති අතර කිසිදු ලාභ මුදලක් ඊට ඇතුලත් කර නැත.

06. ආදායම්
දළ ආදායම පදනම් කර ගනිමින් ලාභාලාභ ගිණුම් සකසා ඇත.

07. බොල්ණය හා අඩමාන ණය වෙන් කිරීම
වර්ෂ අවසානයේ පවත්නා වෙළෙඳ ණයගැති ශේෂවල වයස් විශ්ලේෂණ අනුව වසර 4ට වඩා පැරණි ණයගැති වටිනාකම් සඳහා බොල් හා අඩමාණ ණය වශයෙන් ගිණුම්වල වෙන් කිරීම් කර ඇත.

08. නෛතික කටයුතු
ලංකා කෙට් (පුද්) සමාගමෙන් අයවිය යුතුව ඇති රු.807,187.50 ක මුදල අයකර ගැනීම සඳහා නඩු අංක 53429/එම්.ආර් යටතේ කොළඹ දිසා අධිකරණය යටතේ නඩු පවරා ඇත.

	ඉඩම් , පිරියත් සහ උපකරණ	2010/01/01 දිනට පිරිවැය	වර්ෂය තුල අත්පත් කර ගැනීම	වර්ෂය තුල බැහැර කිරීම	සටහන 01 2010/12/31 දිනට පිරිවැය
1,520,000	කතරගම සංචාරක බංගලා ඉඩම	1,520,000	-	-	1,520,000
6,700,000	කතරගම ස/බ ගොඩනැගිල්ල	6,700,000	-	-	6,700,000
1,497,457	කාර්‍යාලීය ලී බඩු හා උපකරණ	1,497,456	330,429	-	1,827,885
16,650,000	මෝටර් වාහන	16,650,000	90,000	-	16,740,00
1,682,782	යන්ත්‍ර උපකරණ සහ කාර්යාල උපකරණ	1,682,782	642,734	-	2,325,516
28,050,239		28,050,238	1,063,163		29,113,402

	ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන	2010/01/01 දිනට සමුච්ජිත ක්ෂය වෙන්කිරීම්	වර්ෂය සඳහා ක්ෂය වෙනකිරීම්	බැහැර කිරීම් සඳහා ක්ෂය වෙන් කිරීම්	2010/12/31 දිනට සමුච්ජිත ක්ෂය වෙන් කිරීම්
536,000	කතරගම සංචාරක බංගලා ගොඩනැගිල්ල	536.000	268,000.00	-	804,000
568,495	කාර්‍යාලීය ලී බඩු හා උපකරණ	568,495	314,816	-	883,310
7,901,042	මෝටර් වාහන	7,901,042	4,177,500	-	12,078,542
455,039	යන්ත්‍ර උපකරණ සහ කාර්යාල උපකරණ	455,039	384,893	-	839,933
18,589,663		18,589,663	5,145,209		14,605,785
	2010/12/31 දිනට ලියා හරින ලද වටිනාකම				14,507,617

	ආයෝජන	සටහන් 02
3,000,000	දිගු කාලීන ආයෝජන - තිස.මු.සං.බැංකුවේ කොටස්	3,000,000
2,995,530	කොටි කාලීන ආයෝජන	758,506
	එඩ්මන්ටන් රජයේ නි.ක්‍රමයේ නිදන්ගත අරමුදල් ආයෝජන	6,751,832
	පාර්තෝෂික වෙන් කිරීම් ආයෝජන	1,015,068
5,995,530		11,525,406

	තොග ගිණුම්	සටහන් 03
161,611	මෙහෙයුම් අංශයේ තොග	136,054
252,225	ප්‍රධාන කාර්‍යාලයේ තොග	82,319
240,403	කාර්‍යාල සැපයුම් තොග	263,281
654,239		481,654

	වෙළෙඳ ණය ගැතියෝ හා වෙනත් ලැබිය යුතු විවිධ තැන්පතු		සටහන් 04
221,599	වෙළෙඳ ණය ගැතියෝ හා වෙනත් ලැබිය යුතු විවිධ තැන්පතු	(උප ලේඛනය 01)	250,134
13,096,232	සේවා යෝජක ණයකරුවන්	(උප ලේඛනය 02)	18,558,155
4,195,907	කාර්‍ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	(උප ලේඛනය 03)	3,156,503
1,185,787	මොබිලයිජේශන් අත්තිකාරම්	(උප ලේඛනය 04)	386,920
18,699,525			22,351,712

	වෙනත් ලැබිය යුතු	සටහන් 05
18,506	රඳවා ගැනීමේ බදු	46,093
18,506		46,093

	ඉදිරියට කල ගෙවීම්		සටහන් 06
-	ඉන්ධන දීමනා		42,000
40,200	වාහන ලියාපදිංචි ගාස්තු		39,684
40,200			81,684

	මුදල හා මූල්‍යමය අයිතම		සටහන් 07
1,566,678	බැංකු හා ඇතැති මුදල්	(උප ලේඛනය 05)	2,064,506
1,566,678			2,064,506

	ගෙවිය යුතු		සටහන් 08
935,130	කාර්යාල කුලී		-
1,330,215	කොන්ත්‍රාත් කරුවන් සඳහා ගෙවිය යුතු		421,477
440,038	උපචිත වගකීම්	(උප ලේඛනය 6)	455,229
600,400	සැපයුම් සඳහා ගෙවිය යුතු		499,514
347,531	රඳවාගත් මුදල්		266,432
107,900	ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් ගාස්තු		95,000
197,126	ආරක්ෂක තැන්පත්	(උප ලේඛනය 7)	300,916
3,958,340			2,038,568

	ණය හිමියන් සහ අත්තිකාරම්		සටහන් 09
3,567,284	සේවා යෝජකයන්ගෙන් ලැබුණු අත්තිකාරම්	(උප ලේඛනය 8)	2,671,307
27,444,903	විවිධ ණය	(උප ලේඛනය 9)	34,765,079
31,012,187			37,436,386

	ප්‍රතිපාදන		සටහන් 10
1,490,639	විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		1,765,639
16,216,948	පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		17,282,147
156,673	සේවක වන්දි සඳහා ප්‍රතිපාදන		156,673
3,379,076	බොල් සහ අඩමාණ ණය සඳහා වෙන් කිරීම්		3,578,719
168,877	ආර්ථික සේවා ගාස්තු සඳහා ප්‍රතිපදාන		-
21,412,213			22,783,178

	මෙහෙයුම් ආදායම		සටහන් 10
1,064,403	සේවා ගාස්තු ආදායම්	(උප ලේඛනය 10)	857,073
23,607,030	සහාධිපත්‍ය දේපළ සඳහා සහතික නිකුත් කිරීමේ ආදායම	(උප ලේඛනය 11)	46,384,269
7,283,422	අළුත්වැඩියා හා නඩත්තු ආදායම	(උප ලේඛනය 12)	6,817,808
907,375	ප්‍රදීපා ශාලා ආදායම්		-
594,907	විවිධ ආදායම්	(උප ලේඛනය 13)	2,395,332
33,457,137			56,454,482

	මෙහෙයුම් නොවන ආදායම්		සටහන් 12
105,205	ටෙන්ඩර් ඉල්ලුම් පත් ආදායම්		9,000
318,450	ලියාපදිංචි ගාස්තු	(උප ලේඛනය 14)	387,723
5,580	දඩ සහ වෙනත් අයකර ගැනීම්		3,200
126,659	සේවක ණය සඳහා පොලී		126,636
-	ලාභාංශ		150,000
107,880	ඉල්ලුම්පත්‍ර ගාස්තු		82,000
230,075	සමථකරණ ගාස්තු		168,000
-	සම්මන්ත්‍රණ ආදායම		157,090
12,444	සහාධිපත්‍ය ප්‍රකාශන ආදායම්		14,825
456,986	ස්ථාවර තැන්පත් පොලී		-
133,810	ඉතිරිකිරීම් සඳහා පොළිය		28,044
188,050	සහාධිපත්‍ය සඟරාව ආදායම්		30,350
3,487,944	ස්ථාවර වත්කම් විකිණීමෙන් ලාභ	(උප ලේඛනය 15)	-
-	සත්දින තැන්පතු සඳහා පොලිය		211,918
5,173,083			1,368,786

	කාර්‍ය මණ්ඩලය සඳහා වැටුප්	සටහන් 13
360,000	සභාපති දීමනාව	350,000
440,000	සභාපති නිවාස දීමනා	285,000
27,894,219	වැටුප් හා වේතන	25,281,626
2,474,518	සේ.අ.අරමුදල්	2,370,149
618,993	සේ.භා.අරමුදල්	593,817
5,838,721	අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	6,763,607
91,000	ප්‍රසාද දීමනා	518,983
409,500	දිරි දීමනා	-
-	පාර්තෝෂික දීමනා	1,842,520
110,000	අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	75,000
50,000	සේවක වන්දි	-
-	සෞඛ්‍ය අන්තරා සහ අපහසුතා	5,000
-	සේවක සුභ සාධන	90,420
38,286,951		38,176,122

	සැපයුම් සහ පරිභෝජන	සටහන් 14
655,884	මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	671,389
572,148	තේ වියදම්	614,598
1,116,600	මෝටර් රථ සඳහා ඉන්ධන	1,073,094
352,000	ඉන්ධන දීමනා	439,000
116,063	කාර්‍යාලීය සැපයුම්	249,375
-	මෘදුකාංග මිලදී ගැනීම්	49,000
-	වෙබ් අඩවි වාර්ෂික දියත් ගාස්තු	58,080
2,812,695		3,154,536

	නඩත්තු	සටහන් 15
1,657,071	වාහන අළුත්වැඩියා සහ නඩත්තු	2,414,181
120,743	පරිගණක අළුත්වැඩියා සහ නඩත්තු	111,474
235,668	කතරගම සංචාරක බංගලා නඩත්තු	289,175
289,018	ලීබඩු උපාංග , යන්ත්‍ර හා උපකරණ නඩත්තු	246,951
465,473	කාර්‍යාලීය ගොඩනැගිලි නඩත්තු	1,590,414
115,193	කාර්‍යාල නඩත්තු	110,715
2,883,166		4,762,910

	ව්‍යවස්ථාපිත වියදම්	සටහන් 16
508,164	විදුලිය	387,791
864,149	දුරකථන	936.917
260,052	රක්ෂණය	218,753
233,243	ජල බිල්	244,028
57,415	වාහන බලපත්‍ර ගාස්තු	57,464
68,310	තැපල් හා විදුලි පණිවුඩ ගාස්තු	96,481
28,154	නීතිඥ ගාස්තු	18,850
29,700	දන්වීම් සඳහා	174,468
30,993	මාර්ගස්ථ මුදල් රක්ෂන ගාස්තු	30,406
500,646	ප්‍රචාරක වියදම	3,080
-	වරිපනම් හා බදු	161,806
58,405	පුවත්පත්	61,775
307,440	කාර්‍යාල බදු කුලී	307,440
109,020	භාෂා පාරිවර්තන ගාස්තු	51,851
329,500	සමථකරණ ගාස්තු	319,425
3,415,191		3,070,535

	ව්‍යාපෘති / සෘජු වියදම්		සටහන් 17
176,000	සහතික නිකුත් කිරීමේ වියදම්		250,290
409,353	අළුත්වැඩියා සහ නඩත්තු වියදම්	(උප ලේඛනය 16)	339,470
257,245	ප්‍රදීපා ශාලා වියදම්		-
-	අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම		2,100
842,598			591,860

	මූල්‍ය වියදම්	සටහන් 18
275,000	විගණක ගාස්තු	275,000
8,956	හර බදු	7,822
3,850	බැංකු ගාස්තු	395
6,000	ප්‍රසම්පාදන වියදම්	6,000
25,000	ආදායම් බදු	-
243,877	ආර්ථික සේවා ගාස්තු	413,135
392,887	බොල් හා අඩමාණ ණය	556,744

211	තොග ගැලපුම්	6,618
63,171	උපයන විට ගෙවීම් බදු	92,825
1,018,952		1,358,539

	මෙහෙයුම් නොවන වියදම්	සටහන් 19
54,080	සභාපතිතුමා හමුවීමට පැමිණෙන්නන්ට සංග්‍රහ වියදම්	55,468
34,749	විවිධ වියදම්	89,733
271,200	සහාධිපත්‍ය සහරා වියදම්	-
-	දැයට කිරුළ ප්‍රදර්ශණය	250,000
-	ලෝක ජනාවාස දින සැමරුම - තුන්කල් දැක්ම	297,677
-	සම්මන්ත්‍රණ වියදම්	143,025
-	නගමු පුරවර	8,150
360,029		844,053

	විවිධ තැන්පතු	උප ලේඛණ 01
52,120	සේවක ආරක්ෂණ තැන්පතු ආයෝජන	75,655
100,000	ඉන්ධන තැන්පතු	100,000
	ප්‍රසම්පාදන තැන්පතු	5,000
	ටෙලිකොම් තැන්පතු	
69,479	විදුලි බල සැපයු සැපයුම් සඳහා ගාස්තු	69,479
	ලංකා ඔක්සිජන් සිලින්ඩර තැන්පතු	
	තැපැල් මුද්‍රාව භාවිතා කිරීම සඳහා තැන්පතු	
	ප්‍රදීපා ශාලා කුලියට දීම හෝ බ.ස.ශා. තැන්පතුව	
221,599		250,134

	ණය ගැතියෝ	උප ලේඛණ 02
443,331	මාදිවෙල පාර්ලිමේන්තුව මහ ලේකම් කාර්‍යාලය	502,513
1,722,027	උඩුමුල්ල පුරාණ විහාරය	1,722,027
1,447,351	ගම්පහ රෝහල	1,170,295
807,187	ලංකා කේට් (පුද්ගලික) සමාගම	807,187
881,465	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	881,465
198,129	රථ ගාල (මාලිගාවත්ත)	189,129
283,943	ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය	-
672,192	බෙලිහුල්ඔය ව්‍යාපෘතිය	72,192
-	සමර්ලැන්ඩ් ප්‍රොපටි ඩිවලොපර්ස්	1,139,481
5,881,574	ජා.නි.සං. අධිකාරිය	3,875,150
69,853	ගම්පහ නිවාස ක්‍රම නඩත්තුව - ජා.නි.සං.අ	-
-	ෆැටිග්නම් රියලටි ඉන්වෙස්ට්මන්ට්	2,439,871
529,213	සමථකරණ ගාස්තු	556,529
48,000	විමධ්‍යගත සහ පළාත් සභා අරමුදල්	48,000
26,217	කතරගම සංචාරක බංගලාව වෙන් කිරීම	10,868
-	ජල්තර රජයේ සේවක නිවාස ක්‍රමයේ විදුලි බිල්	714,523
94,750	මීගමුව රෝහල - පොම්පාගාර ගාස්තු	502,623
-	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	96,858
-	හිඹුටු උයන	316,021
-	එල්.එච්.ජී.ප්‍රොපටි ඩිවලොපර්ස් (පුද්) සමාගම	2,416,719
-	සීගල් ප්‍රොපටි ඩිවලොපර්ස් (පුද්) සමාගම	63,027
-	සන්සිටි ප්‍රොපටි ඩිවලොපර්ස් (පුද්) සමාගම	785,335
-	හෙසනයිට් ප්‍රොපටි ඩිවලොපර්ස් (පුද්) සමාගම	248,342
13,105,232		18,558,155

	ණය සහ අත්තිකාරම්	උප ලේඛණ 03
7,753	ටී.පී.සිරියාවති	7,753
474,050	මිලදී ගැනීම් අත්තිකාරම්	25,955
70,726	විශේෂ අත්තිකාරම්	-
3,394,278	ආපදා ණය	2,818,694
131,500	විශේෂ ආපදා ණය	192,500

117,600	උත්සව අත්තිකාරම්	111,600
4,195,907		3,156,502
	මොබිලිපේශන් අත්තිකාරම්	**උප ලේඛණ 04**
118,000	ලක්මාල් බිල්ඩර්ස් (මාලිගාවත්ත)	-
588,032	එල්.කේ.අයි. කන්ස්ට්‍රක්ෂන් (මාලිගාවත්ත)	-
242,717	මෙස්කෝ කන්ස්ට්‍රක්ෂන් (මැනිං ටවුන්)	-
237,038	අරලිය කන්ස්ට්‍රක්ෂන් (මැනිං ටවුන්)	-
-	නෙලුෂ් කන්ස්ට්‍රක්ෂන්	386,920
1,185,787		386,920
	බැංකු සහ ඇතැති මුදල්	**උප ලේඛණ 05**
603,568	මහජන බැංකුව	1,292,546
963,110	ලංකා බැංකුව	771,960
1,566,678		2,064,506

	උපචිත වගකීම්	**උප ලේඛණ 06**
339,516	ගෙවිය යුතු සේ.අ.අරමුදල්	361,779
4,359	මුද්දර ගාස්තු	5,307
26,101	තෙවන පාර්ශවීය අධුකිරීම්	37,278
23,763	ගෙවිය යුතු රඳවාගත් බදු	1,531
46,299	ගෙවිය යුතු සේ.භා.අරමුදල්	49,334
440,038		455,229
	ආරක්පක තැන්පතු	**උප ලේඛණ 07**
135,006	කොන්ත්‍රාක්කරුවන්ගේ ආරක්ෂන තැන්පතු	225,261
62,120	සේවක ආරක්ෂක තැන්පතු	75,655
197,126		300,916
	ගනුදෙනුකරුවන්ගෙන් ලැබෙන අත්තිකාරම්	**උප ලේඛණ 08**
1,105,705	විමධ්‍යගත / පළාත් සහා අරමුදල්	981,540
104,453	විදුලි බල මණ්ඩලය	104,453
1,309,846	මාලිගාවත්ත හදිසි අළුත්වැඩියා කටයුතු	603,814
766,151	මැනිං ටවුන් හදිසි අළුත්වැඩියා කටයුතු	-
281,129	සොයිසාපුර හදිසි අළුත්වැඩියා කටයුතු	-
-	නගමු පුරවර	981,500
3,567,284		2,671,307
	විවිධ ණය හිමියෝ	**උප ලේඛණ 09**
9,575,215	නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය	9,575,215
15,733,971	භාණ්ඩ හා සේවා බදු	15,733,971
1,573,674	එකතු කල අගය මත බදු	1,991,305
311,539	ජාතිය ගොඩනැගීමේ බද්ධ	406,543
377	විවිධ අත්තිකාරම්	1,024
223,014	ධීවර දෙපාර්තමේන්තුව	223,014
21,740	එම්.අරුන්කුමාර්	-
5,373	මොඩර්න් හවුසිංග් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්	-
-	තනූජා දිනේෂිකා	81,850

	එඩ්මන්ටන් රජයේ සේවක නිවාස ක්‍රමයේ නිදන්ගත අරමුදල	6,751,832
	ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය	325
27,444,903		34,765,079
	සේවා ගාස්තු ආදායම	**උප ලේඛණ 10**
1,064,403	විමධ්‍යගත / පළාත් සහා ව්‍යාපෘති සේවා ගාස්තු	857,073
1,064,403		857,073
	සහාධිපත්‍ය සහතික නිකුත් කිරීමට අදාල අදායම	**උප ලේඛණ 11**
17,906,951	ඉදිකර අවසන් කර ඇති දේපළ සහතිකය	37,330,049
297,717	ඉදිකිරීම් ආරම්භ කරන ලද දේපළ සඳහා ලබා දෙන සහතිකය	5,237,320
5,402,362	අර්ධ ඉදිකිරීම් සඳහා නිකුත් කරන ලද සහතිකය	3,816,900
23,607,030		46,384,269
	අළුත්වැඩියා සහ නඩත්තු ආදායම	**උප ලේඛණ 12**
2,345,297	මාදිවෙල පාර්ලිමේන්තු නිවාස සංකීර්ණ නඩත්තු ආදායම	2,491,288
1,635,504	මීගමුව රෝහල පොම්පාගාර නඩත්තු ආදායම	1,471,929
2,515,468	ගම්පහ රෝහල පොම්පාගාර නඩත්තු ආදායම	1,820,916
28,975	හදිසි අළුත්වැඩියාවන් හදිසි අළුත්වැඩියා ආදායම	307,042
31,550	කළමනාකරණ සංස්ථාවල හදිසි අළුත්වැඩියා ආදායම	-
726,628	ගම්පහ නිවාස ක්‍රමය නඩත්තු ආදායම	726,633
7,283,422		6,817,808
	විවිධ ආදායම්	**උප ලේඛණ 15**
255,771	කතරගම සංචාරක බංගලා ආදායම	333,550
30,833	වෙනත් ආදායම්	1,770,854
213,041	රක්ෂන වන්දි	158,888
95,262	විවිධ අයකිරීම්	-
-	වාහන කුලී ආදායම්	132,040
594,907		2,395,332
	ලියාපදිංචි කිරීමේ ගාස්තු	**උප ලේඛණ 16**
7,000	කොන්ත්‍රාක්කරුවන් ලියාපදිංචි ආදායම	6,000
-	පුද්ගලික කළමනාකරණ සංස්ථා ලියාපදිංචි ආදායම	90,650
-	පුද්ගලික කළමනාකරණ සංස්ථා ලියාපදිංචි අළුත්කිරීමේ ආදායම	250,173
-	රජයේ නිවාස ක්‍රමවල කළමනාකරණ සංස්ථා ලියාපදිංචි ආදායම	9,000
-	රජයේ නිවාස ක්‍රමවල කළමනාකරණ සංස්ථා ලියාපදිංචි අළුත්කිරීමේ ආදායම	14,000
-	සුනාමි නිවාස ක්‍රම වල කළමනාකරණ සංස්ථා ලියාපදිංචි අළුත්කිරීමේ ආදායම	200
	පුද්ගලික කළමනාකරණ කමිටු ලියාපදිංචි ආදායම	10,500
-	පුද්ගලික කළමනාකරණ කමිටු ලියාපදිංචි අළුත්කිරීමේ ආදායම	5,500
-	රජයේ නිවාස ක්‍රම වල කළමනාකරණ කමිටු ලියාපදිංචි කිරීමේ ආදායම	450
-	රජයේ නිවාස ක්‍රම වල කළමනාකරණ කමිටු ලියාපදිංචි අළුත්කිරීමේ කිරීමේ ආදායම	1,000
-	සුනාමි නිවාස ක්‍රම වල කළමනාකරණ කමිටු ලියාපදිංචි කිරීමේ ආදායම	250

318,450		387,723
	ස්ථාවර වත්කම් සහ ගබඩා භාණ්ඩ විකිණීමෙන් ලාභය	**උප ලේඛණ 15**
2,968,457	මෝටර් වාහන විකිණීම	-
174,974	යාන්ත්‍රික මෙවලම් හා උපකරණ විකිණීම	-
205,656	ලී බඩු සහ උපාංග	-
138,857	ගබඩා අයිතම විකිණීම	-
3,487,944		-
	අළුත්වැඩියා හා නඩත්තු වියදම්	**උප ලේඛණ 16**
13,434	ජා.නි.සං.අධිකාරියේ අළුත්වැඩියා හා නඩත්තු වියදම්	3,842
15,670	මීගමුව රෝහල පොම්පාගාර නඩත්තු වියදම්	13,675
239,168	මාදිවෙල පාර්ලිමේන්තු නිවාස ක්‍රමය නඩත්තු වියදම්	305,999
-	ගම්පහ රෝහල පොම්පාගාර නඩත්තු වියදම්	10,184
141,081	පොම්පාගාර අළුත්වැඩියාව සහ නඩත්තු	-
-	ජල්තර නිවාස ක්‍රම නඩත්තුව	5,770
409,353		339,470

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
2010/12/31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරම් සඳහා මුදල් ප්‍රවාහය		41,988
ආදායම් බදු සහ විශේෂිත වූ අයිතම වලට පෙර ශුද්ධ අලාභය		
ගැලපීම		
ක්ෂය වෙන් කිරීම		5,145,209
ආයෝජන ආදායම		(516,598)
පොලී වියදම්		
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		4,670,600
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම		
තොග අඩුවීම	(67,819)	
ණයගැති වැඩිවීම්	(3,652,187)	
වෙනත් ලැබිය යුතු ශේෂ වැඩිවීම්	(27,587)	
ඉදිරියට කල ගෙවීම අඩුවීම	198,919	
ගෙවිය යුතු ශේෂ අඩුවීම	(1,919,771)	
උපචිත වියදම් අඩුවීම	(408,354)	
ණය හිමියෝ වැඩිවීම	6,424,199	
ප්‍රතිපාදන වැඩිවීම	1,370,965	1,918,365
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ජනිත වන මුදල් ප්‍රවාහය		6,588,965
පොලී ගෙවීම්		
ආදායම් බදු ගෙවීම්		14,695
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය		6,574,270
ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය		
ආයෝජන	(5,529,876)	
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(1,063,163)	
ස්ථාවර වත්කම් විකිණීම	-	
පොලී ලැබීම්	366,597	
ලාභාංශ ලැබීම්	150,000	
ආයෝජන ක්‍රියාකාරම් සඳහා යොදවන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		(6,076,422)
මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය		
දිගු කාලීන ණය ලැබීම්	-	
මූල්‍ය කල්බදු පහසුකම් සඳහා ගෙවීම්	-	
ලාභාංශ ගෙවීම	-	
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදවන මුදල්	-	
මුදල් හා මුදල් සමාන දෑ සඳහා ශුද්ධ මුදල් ප්‍රවාහය		497,828
ආරම්භක ශේෂය - මුදල් හා මුදල් සමාන දෑ		1,566,678
අවසාන ශේෂය - මුදල් හා මුදල් සමාන දෑ		2,064,506

විගණකාධිපති වාර්තාව

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන
සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ
14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්ථාව

සභාධිපත්‍ය කළමණාකරණ අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන යටතේ විගණනය කරන ලදි . 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්ථාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්ථාවේ දැක්වේ . මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර සවිස්තරාත්මක වාර්ථාවක් 2011 අප්‍රේල් 21 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

විගණන වාර්තාව	අධිකාරියේ මතය
1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යෙදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.	
1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්ථාවේ ඇතුළත් විගණන මතය අදහස් දැක්වීම සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇති එම සමාලෝචනය හා පරීක්ෂණයන් ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකි තාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියල කරන ලද්දකි . මූල්‍ය ප්‍රකාශනයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණය සිදු කරන ලදි මූල්‍ය ප්‍රකාශනයන් හි දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියදි පදනම මත පරීක්ෂා කිරීම් මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි .ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයි විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 1 3 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.	
මූල්‍ය ප්‍රකාශන	
2.1 මතය	
මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සභාධිපත්‍ය කලමනාකරණ අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට සභාධිපත්‍ය කලමනාකරණ අධිකාරියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.	

විගණන වාර්තාව	අධිකාරියේ මතය
2.1 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම	**2.1 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
2.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවූ අවස්ථා	2.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවූ අවස්ථා
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.	
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16	**2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**
සමාලෝචිත වර්ෂය අවසානයට පාරිතෝෂික වෙන් කිරීම රු 17,282,147 ක් වුවත් ප්‍රමිතියට අනුව බැරකම ආවරණය වන ලෙස රු 1,000,000 ක් පමණක් ආයෝජනය කිරීමට කටයුතු කර තිබුණි.	2011 වර්ෂය අවසන් වීමට ප්‍රථම මෙම ප්‍රතිපාදන 25% කින් වැඩි කිරීමට උපදෙස් දෙන ලදි.
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18	**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18**
ප්‍රමිතය ප්‍රකාරව පරිගණක ලේසර් ප්‍රින්ටර්, ෆැක්ස් යන්ත්‍ර, දුරකථන යනාදී වත්කම් ක්ෂය කිරීම් ප්‍රතිශතය ගණනය කිරීමේ දී එම වත්කම් වල සුන්බුන් අගය හා ජීව කාලය සළකා බැලිය යුතු වුවත්, එසේ කර නොතිබුණි.	මේ සඳහා කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධ උපදෙස් ලබා දී අවශ්‍ය ක්‍රියා මාර්ග පහත ඇති 2011 වර්ෂයේ අවසන ගිණුම් සකස් කිරීමේ දී මෙම තත්වය නිවරුදි කරනු ඇත.
2.2.2 ගිණුම්කරණ අඩුපාඩු	**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**
(අ) රු 8,525,406 ක් වටිනා කෙටි කාලීන ආයෝජන ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.	(අ) මෙම වටිනාකමෙන් කෙටි කාලීන ආයෝජන වශයෙන් රු 5,525,406 ක් ද දිගු කාලීන ආයෝජන වශයෙන් රු 3,000,000 ක් ද ගිණුම් වාර්ථා වල පෙන්නුම් කිරීමට කටයුතු යොදා ඇත.
(ආ) සමාලෝචිත වර්ෂයේ දී පළාත් සභා අරමුදල් යටතේ නිම කරන ලදි, කොන්ත්‍රාත් 10 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු 1,557,961 ක බැරකම් ගිණුම් ගත කර නොතිබුණි.	(ආ)වර්ෂය තුළදී නිම කරන ලද කොන්ත්‍රාත් ගණුදෙනු උපචිත පදනම යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබයි.
(ඇ)ණයගැති ශේෂයෙන් 14% ක් වන රු 3,157,476 වන ණයගැති ශේෂය අයකර ගත නොහැකි ලෙස අධිකාරිය හඳුනාගෙන තිබියදීත් ඒ වෙනුවෙන් 3% ක වාර්ෂික බොල් ණය හා අඩමාන ණය ප්‍රතිපාදනයක් කිරීමේ ප්‍රමාණාත්මක භාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය.	(ඇ)ණයගැති වයස් විශ්ලේෂණය පදනම් කර ගනිමින් අඩමාණ ණය හා බොල් ණය ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් නැවත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන ලදි.
(ඈ) සමාලෝචිත වර්ෂයේ දී නිම කරන ලද කෝන්ත්‍රාත් 16 ක් වෙනුවෙන් ලැබිය යුතු රු 4,722,340 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.	(ඈ) වර්ෂය තුළදී නිම කරන ලද කොන්ත්‍රාත් ගණුදෙනු උපචිත පදනම යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබයි.
(ඉ) සමාලෝචිත වර්ෂයේ දී නගමු පුරවර වැඩසටහන යටතේ ඊර්බිය අමාත්‍යංශයෙන් ලැබී තිබුනු රු 1,500,000 ක මුදලින් රු 981,500 ක් පමණක් ශේෂ පත්‍රයේ දක්වා තිබුනු නමුත් ඉතිරි රු 518,500 ක මුදල ගිණුම්වල පෙන්වා නොතිබුණි.	(ඉ)නගමු පුරවර ව්‍යාපෘතිය සඳහා 2010/10/18 දින රිසිට්අංක 65286 මගින් රු, 1,500,000 ක් ලැබී තිබුණ, ඒ අනුව මෙම මුදල මාලිගාවත්ත නිවාස ක්‍රමයේ කේ්ඒ් ජේ ගොඩනැගිලි වලට අදාල කාණු සහ කේ ගොඩනැගිල්ලේ පිටුපස පාර අලුත් වැඩියා කටයුතු සඳහා ලැබුන අත්තිකාරම් මුදලක් බැවින් අදාල අලුත් වැඩියා කටයුතු ආරම්භ කරන අවස්ථාවේ දි එනම් 2010/11/02 දින රජ්‍යය ඉංජිනේරු සංස්ථාවට රු 142,300 ක් සහ ගොඩනැගිලි දෙපාර්තුමේන්තුවට රු 376,200 ක් වශයෙන් ගෙවීමෙන් පසු ඉතිරි මුදල වන රු 981,500 ක මුදල ගණුදෙනු කරුවන්ගෙන් ලැබුණු අත්තිකාරම් වශයෙන් ගිණුම් වල පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත. එහෙත් විගණන වාර්ථාවේ පෙන්නුම් කර දී ඇති කරුනු සැළකිල්ලට ගෙන 2011 වර්ෂයේදී මෙම ගනුදෙනු වෙන් වෙන්ව ගිණුම් වල ගැලපීමට කටයුතු කර ඇත.

විගණන වාර්තාව	අධිකාරියේ මතය
2.2.3 අඛණ්ඩ පැවැත්ම	**2.2.3 අඛණ්ඩ පැවැත්ම**
අධිකාරියේ ශුද්ධ වත්කම් සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ 02ක පිළිවලින් රු 12,841,863 රු 12,869,156ක් හා 6,124,654 වශයෙන් සෘණ අගයක් ගත් අතර ජංගම අනුපාතය පිළිවලින් 1:25, 1:2:8, 1:1:7 ක් වන බැවින් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම ප්‍රශ්නකාරී වේ . 2003 වර්ෂයේ සිට අදාල පිරිවැය පියවා ගැනීම වෙනුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් උපයන ආදායම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් විවිධ ණයගැති ශේෂ අයකර වැටුප් ගෙවීම සඳහා යෙදවීමටත් ණයහිමි ශේෂ නිරවුල් නොකර සිටීමටත් සිදුවූ බව හා මෙම තත්වය ජංගම අනුපාතය අහිතකර තත්වයකට පත් වීමට ප්‍රධාන හේතුව වශයෙන් බලපා ඇති බව අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා විසින් මා වෙත දන්වා තිබුණි.	2003 වර්ෂයේ සිට අදාල පිරිවැය පියවා ගැනීම වෙනුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් උපයන ආදායම ප්‍රමාණයත් නොවීම හේතුවෙන් විවිධ ණයගැති ශේෂ අයකර වැටුප් ගෙවීම සඳහා යෙදවීමටත් ණය හිමි ශේෂ නිරවුල් නොකර සිටීමටත් සිදුවී ඇති බැවින් මෙම ජංගම අනුපාත අහිතකර තත්වයකට පත් වීමට ප්‍රධාන හේතුවක් විය. තාවකාලික විසඳුමක් ලෙස මෙම තත්වය භාණ්ඩාගාර ලේකම් තුමා වෙත පැහැදිලි කිරීමෙන් පසු 2012 වර්ෂයේ වැටුප් ගෙවීම සඳහා රු මිලියන 40 ක් වෙන් කිරීමට කටයුතු කර ඇත. ඊට අතිරේකව දිගු කාලීන විසඳුමක් වශයෙන් අධිකාරිය සංස්ථාපනය කළ 1973 අංක 10 දරණ සභාධිපත්‍ය කළමනාකරණ පනත අධිකාරියේ ආදායම් මාර්ග සම්බන්ධ දැඩි ලෙස සැලකිල්ලට ගනිමින් සංශෝධනය කිරීමට යෝජිතය. එම යෝජනා I ගොඩනැගිලි සැළසුමට අනුමැතිය ලැබුනු පසු සෑම සභාධිපත්‍ය දේපලක්ම ඉදිකිරීම් නිම කිරීමට ප්‍රථම තාවකාලික සභාධිපත්‍ය සහතිකය අනිවාර්යෙන්ම ලබා ගත යුතු බවට නියම කිරීම. II සභාධිපත්‍ය දේපලක අයිතිය පැවරීමේදී අයකරනු ලබන මුද්දර බද්දෙන් වැඩි ප්‍රතිශතයක් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අරමුදලට බැර කළ යුතු බවට නියම කිරීම. III සභාධිපත්‍ය කොටස් වල අයිතියට සමානුපාතිකව මෙම අධිකාරියට ගාස්තු අය කල හැකි බවට දැනට ඇති නියමය වරිපනම් ගාස්තුවෙන් ප්‍රතිශතයක් ලෙස අයකල යුතු බවට නියම කිරීම. IV සෑම කළමනාකරණ සංස්ථාවක්ම වාර්ෂිකව මෙම අධිකාරියේ ලියාපදිංචි විය යුතු බවට නියම කිරීම. V පොදු අංගෝපාංග වෙනම පිහිටුවා ඇති කොටස් කරන ලද ඉඩම් කැබලි වල නිවාස තනා ඇති නිවාස සංකීර්ණ (අතුරුගිරියේ මිලේනියම් සිටි, ජා ඇල නිවාසි පුර) සඳහා ද මෙම අධිකාරියේ සහතිකයක් ලබා ඒවායේ පොදු අංගෝපාංග පාලනයට කළමනාකරන සංස්ථා වැනි ව්‍යුහයක් හඳුන්වා දීම. VI සභාධිපත්‍ය දේපලක අනවසර ඉදිකිරීමක් සිදුකර ඇති බවට මෙම අධිකාරිය විසින් තහවුරු කර ගත් දින සිට අදාල කුමන පාර්ශවයක් විසින් හෝ එය ඉවත් කරන තෙක් මෙම අධිකාරියට දඩ මුදලක් ගෙවිය යුතු බවට නියම කිරීම. VII සභාධිපත්‍ය දේපලක් නිම කිරීමෙන් පසු අදාල කාල සීමාවේදී ලියාපදිංචි නොකරන අවස්ථාවකදී දැනට අධිකරණයට ගෙවිය යුතු බවට තීරණය කරන ලද දඩ මුදලින් කොටසක් මෙම අධිකාරියේ අරමුදලට ගෙවිය යුතු බවට නියම කිරීම. මේ වන ඉහත යෝජනා ඇතුලත් පනත් කෙටුම්පතක් කැබිනට් මණ්ඩලය විසින් කැබිනට් අනුකාරක සභාව වෙත යොමු කර සාකච්චා කරමින් පවති.

විගණන වාර්තාව	අධිකාරියේ මතය
2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්	**2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්**
ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු 3,875,150 ක් වූ සේවා දායක ණය ගැති ශේෂයක් හා ගෙවිය යුතු රු 1,585,314 ක් වූ සේවා දායක අත්තිකාරම් ජාතික නිවාස සංවර්ධන අධිකා-ාරියේ ගිණුම් අනුව පිළිවෙලින් රු 2,262,134 හා රු 20,984,863 ක් වූ බැවින් වෙනස්කම් හඳුනාගෙන ගිණුම් වල අවශ්‍ය ගැලපීම් කිරීමට පියවර ගෙන නොතිබුණි.	මෙම හිග මුදල් අයකර ගැනීම සඳහා ආයතන දෙකෙහි සභාපතිවරුන් සමග පැවැති සාකච්චාවේදී ගනු ලැබූ තීරණ අනුව අදාල හිග මුදල සම්බන්ධ පරීක්ෂා කර බලා වාර්ථා කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදි . එමෙන්ම 2010-10-30 දින වන විට හිග මුදලින් රු මිලියන 4.5 ක් ලබා දීමටද කටයුතු කර ඇත.
2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්	**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. (අ) වසර 05කට වැඩි කලක සිට ඉදිරියට ගෙන එන රු 3,672,000 ක් වූ සේවා දායක ණයගැතියන් 05 දෙනෙකුගෙන් ලැබිය යුතු ණය අයකර ගැනිමටත් රු 25,636,653 ක් වූ ණය හිමි ශේෂ 04ක් නිරවුල් කිරීමට අධිකාරිය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.	වසර 05කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද රු 3,672,000 ක් වූ ණය ගැති ශේෂ පහත පරිදි වේ. රු උඩුමුල්ල පුරාණ විහාරය — 1,722,027 වන ජීවී සංරක්ෂණ දෙපා. — 881,465 මාලිගාවත්ත රථගාල — 189,129 ලංකා කෙට් (පුද්) සමාගම — 807,187 බෙලිහුල්ඔය ව්‍යාපෘතිය — 72,192 එකතුව — 3,672,000 මෙම ණයගැති ශේෂයන්ගෙන් අංක 1 සහ 3ට අදාල ණයගැති ශේෂ වටිනාකම වන රු 1,911,156ක් පොත් වලින් ඉවත් කල යුතුව ඇති බැවින් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක් ඉදිරිපත් කිරීමටත් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු වටිනාකම අය කර ගැනීම සඳහා නැවත දැනුම් දීමටත් තීරණය කරන ලදි. ඉතිරි ණය ගැති ශේෂයන්ගෙන් රු 807,187ක මුදල අයකර ගැනීම සඳහා නඩු අංක 53429/එම්.ආර් යටතේ නීතිමය කටයුතු කරමින් පවත්නා අතර බෙලිහුල්ඔය ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතුව තිබූ රු 72,192 ක වටිනාකම දින ලැබී ඇත. එමෙන්ම ගෙවිය යුතුව ඇති ණය හිමි ශේෂ නිරවුල් කිරීම සඳහා ආයතනයේ පවත්නා මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් තව දුරටත් කාලය ලබා ගැනීමට සිදුව ඇත.
(ආ) වටිනාකම රු 12,667,999 ක ණයහිමි ශේෂ 03 කට හා රු 18,945,075 ක ණයගැති ශේෂ 02 කට අදාලව ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි .	(ආ) සියලුම ණය හිමි ශේෂ හා ණයගැති ශේෂ සනාථ කිරීමේ ලිපි යවා ඇති නමුත් එම ශේෂ සනාථ කර එවීමට කටයුතු කර නොමැත.
2.2.6 නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණයන්ට අනුකූල නොවීම	**2.2.6 නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණයන්ට අනුකූල නොවීම**
පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය	

නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව	අනුකූල නොවීම	
(අ) මුදල් රෙගුලාසි සංග්‍රහය මු රෙ 104	සමාලෝචිත වර්ෂය තුළ මෝටර් වාහන වලට සිදුවූ රු 164,783ක් වටිනා අනතුරු සම්බන්ධයෙන් මු රෙ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	(අ) මුදල් රෙගුලාසි සංග්‍රහය මු රෙ 104 2010 වර්ෂයේ වාහන අනතුරු සම්බන්ධ පරීක්ෂණ පවත්වා අවසන් කිරීමට කටයුතු කරනු ලබන අතර අනතුරු සිදු වීමේදී ඉදිරියටද මෙම ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි.

විගණන වාර්තාව		අධිකාරියේ මතය
මු රෙ 255 (1)	සෑම ගෙවීමක් සඳහාම වව්චර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් 2010 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල නිළධාරීන්ට ගෙවා තිබූ රු 1,177,209ක නිවාඩු දින වැටුප් සඳහා වූ ගෙවීම් වව්චර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මු රෙ 255 (1) සියලුම ගෙවීම් වලට අදාල වව්චර රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කරන ලදි ඒ අනුව නිළධාරීන්ට ගෙවනු ලද නිවාඩු දින වැටුප් මුදල වන රු 1,177,209ක මුදල ඒ ඒ මාසයේ වැටුප් සමග ගෙවීම් කර ඇති බැවින් අදාල වැටුප් ගෙවීම වව්චරයේම මෙම වටිනාකම ඇතුලත්ව ගෙවීම් කරන ලදි. එමෙන්ම වැටුප් සකස් කිරීම පරිගණකය මගින් සිදු කරනු ලබන බැවින් සේවකයන්ට අදාල සියළුම ගෙවීම් වව්චරය සමග අමුණා තැබීමටද කටයුතු කර ඇත. ඊට අතිරේඛව නිවාඩු දින දීමනා ගෙවීම් වලට අදාල නිවාඩු පත්‍රිකා සීඑම්ඒ/6/10/42 ලිපි ගොනුවෙහි ගොනුකර තැබීමටද කටයුතු කරන ලදි.
(ආ) 1997 මැයි 03 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 118 (අ)	මාණ්ඩලික නිළධාරීන් සඳහා මාසයකට එක් දිනක් සඳහා පමණක් නිවාඩු දින වැටුප් ගෙවිය හැකි වුවද එයට අමතරව නිවාඩු දින 1ක් වෙනුවෙන් රු 79,961 ක් නිවාඩු දින වැටුප් වැඩිපුර ගෙවා තිබුණි.	ආ) 1997 මැයි 03 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 118 (අ) වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සහ සංයුක්ත සැළසුම් අනුව වර්ෂයක් තුළ කළමණාකරණ සංස්ථා 100කට අධික ප්‍රමාණයක් පිහිටුවා අධිකාරියේ ලියාපදිංචි කරවීම සඳහා සැළසුම් කර ඇති මෙය රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකේහිම සභාධිපත්‍ය දේපල සඳහා අදාල වේ. ඉහත කටයුත්ත කරගෙන යාමේදී කළමණාකරන සංස්ථා පිහි-ටුවිමට ප්‍රථම නිවාසියන් හමුවීම සඳහා එම සභාධිපත්‍ය දේපල තුල පදිංචිකරුවන් සමග නිළධාරීන්ට සම්බන්ධ වීමට සිදුව ඇති එමෙන්ම පිහිටුවා ඇති කළමනාකරණ සංස්ථාවට මහ සභා රැස්වීම්, විශේෂ මහා සභා රැස්වීම් ආදියටද සහභාගී වීම සඳහා සිදුවේ. මෙවැනි රැස්වීම් පවත්වනුයේ සතියේ සෙනසුරාදා හා ඉරිදා දින වල මෙන්ම බොහෝ විට සවස 6,00 පසුවද වීමට ඉඩ ඇති එමෙන්ම ඊට අතිරේඛව විශේෂයෙන් පවරනු ලබන රාජකාරී සඳහා ද නිළධාරීන් අතිරේක නිවාඩු දින වල සේවයේ යෙදවීමට සිදුවේ, මෙම තත්වයන් සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු පැහැදිලි කිරීමෙන් පසු 2007/02/27 දින රැස්වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත චක්‍රලේඛය මගින් නියම කරන ලද දිනයට අතිරේඛව තවත් එක් දිනයක් නිවාඩු දින වැටුප් (1/20) ගෙවීමට අනුමැතිය ලබා දී ඇත.
(ඇ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12		(ඇ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12
2 2 1 (ආ) ඡේදය		2 2 1 (ආ) ඡේදය
වාර්ෂික වාර්ථා නියමිත කාළ රාමුවක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත් අධිකාරිය විසින් වසර 2006 සිට 2009 දක්වා වූ වාර්ෂික වාර්ථා මේ දක්වා සභාගත කර නොතිබුණි.		2006, 2007 සහ 2008 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්ථා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යංශය වෙත යොමු කර ඇති අතර 2009 වර්ෂයට අදාල වාර්ෂික වාර්ථාව මුද්‍රණය කර අවසන් වී ඉදිරි සතිය තුලදී අමාත්‍යංශය වෙත යොමු කිරීමට නියමිතව ඇත.

විගණන වාර්තාව	අධිකාරියේ මතය
මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය	**මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**
3 1 මූල්‍ය ප්‍රතිඵල	3 1 මූල්‍ය ප්‍රතිඵල
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ ශුද්ධ ලාභය රු මිලියන 27,293 ක් වූ අතර ඊට ප්‍රතිරූපී ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය රු 16,768,236 ක් විය නැවත නොගෙවිය යුතු යැයි හඳුනාගත් රු 1,261,729 ක් වූ ණයහිමි ශේෂ හා රු 484,103 ක උපචිත කරන ලද වැඩිපුර ප්‍රතිපාදන ආදායම් ලෙස ගිණුම් ගත කිරීම සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයට හේතුවී තිබුණි.	අධිකාරියේ ගිණුම් වාර්ථා 2009 වර්ෂය සමග සංසන්දනාත්මකව බැලීමේදී 2009 වර්ෂයට සාපේක්ෂව සමස්ථ ආදායම 2010 වර්ෂයේ දී 49.74% කින් ඉහල ගොස් ඇති අතර නැවත නොගෙවිය යුතු යැයි හදුනාගත් ණය හිමි ශේෂ හා උපචිත කරන ලද වැඩිපුර ප්‍රතිපාදන ආදායම් ලෙස ගැලපීම් වලින් සමස්ථ ආදායම ඉහළ යාමේ ප්‍රතිශතය 4.4% ක් පමණි. එමෙන් 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේදී සමස්ථ වියදම් වැඩිවීමේ ප්‍රතිශතය 4.5% කි . එයද සමස්ථ නඩත්තු වියදම් ඉහල යාම ප්‍රධාන හේතුවක් වශයෙන් දැක්වීමට හැකියාව ඇත. මේ අනුව 2009 වර්ෂයේ රු මිලියන 16,7 ක්ව තිබූ අලාභය 2010 වර්ෂයේදී රු 27,293 ක අලාභදායී තත්වයකට ගෙන ඒම මගින් ආදායම් වියදම් සමාන තත්වයකට පරිවර්ථනය කර ගැනීමට අධිකාරියට හැකියාව ලැබී තිබේ මෙම තත්වය තුල අධිකාරිය පසුගිය වර්ෂවලට සාපේක්ෂ ව යම් ප්‍රතිශතයක් ලබා ඇති බව පෙනී යනු ලබයි.
3.2 මෙහෙයුම් සමාලෝචනය	**3.2 මෙහෙයුම් සමාලෝචනය**
3.2.1 කාර්ය සාධනය	**3.2.1 කාර්ය සාධනය**
(අ) 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 5 (ඉ) වගන්තියට අනුව සභාධිපත්‍ය දේපල කළමනාකරන සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම කල යුතු වුවද සමාලෝචිත වසර තුල සභාධිපත්‍ය සහතික නිකුත් කිරීම් 66 ක් වූ අතර එම සභාධිපත්‍ය දේපල වල ලියාපදිංචි කරන ලද කලමනාකරණ සංස්ථා සංඛ්‍යාව 36 ක් පමණක් වී තිබුණි.තවද පනතේ 5 (ඌ) වගන්තියට අනුව සභාධිපත්‍ය දේපලේ පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතනයක් වෙත පැවරීමට කටයුතු කර නොතිබූ අතර 5 (ඕ) වගන්තිය ප්‍රකාරව සභාධිපත්‍ය දේපල නැවත සංවර්ධනය කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කර නොතිබුණි.	පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ (අ)සමාලෝචිත වර්ෂය තුළ සභාධිපත්‍ය සහතික 66ක් නිකුත් කර තිබුනද ඉන් 31 ක්ම නිකුත් කර තිබුනේ ඒකක 5 සහ ඊට අඩු සභාධිපත්‍ය දේපල සඳහාය. මේ හේතුව නිසා පනතේ 5(ඉ)වගන්තිය අනුව එම නිවාස ඒකක වල අයිතිය දරන්නේ පවුලේම යැපෙන්නන් බැවින් කලමනාකරණ සංස්ථා පිහිටුවීමට ප්‍රායෝගික තත්වයක් නොමැත. තවද පනතේ 5(ඌ) වගන්තිය අනුව සභාධිපත්‍ය දේපලේ පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්චා කර නාගරික කොමසාරිස් වරුන් දැනුවත් කිරීමටද කටයුතු කර ඇති එහෙත් විවිධ හේතු මත පළාත් පාලන ආයතන මෙතෙක් ඇතුලත් පාරවල් ළමා ක්‍රීඩාංගන භාර ගැනීමට කැමැත්තක් දක්වන්නේ නැති තවද මේ සම්බන්ධව අන්තර් අමාත්‍යංශ කමිටුවේද සාකච්ඡා කිරීමට කටයුතු යොදා ඇත. එමෙන්ම පනතේ 5(ඕ) වගන්තිය අනුව සභාධිපත්‍ය දේපල නැවත සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් සකස් කර අනුමැතිය සදහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම සදහා නියමිතව ඇති බැවින් ඒ සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලෙස දිගින් දිගටම භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කරන ලදි . එහෙත් එම කටයුතු සඳහා රු මිලියන 15 ක් 2011 වර්ෂයේදී ප්‍රථමයෙන් ප්‍රතිපාදන ලබා දී ඇති අතර එම ප්‍රතිපාදන මගින් වේල්ස් කුමාර මාවත ටොරින්ටන් නිවාස ක්‍රමය හා වෑකන්ද නිවාස ක්‍රමය සදහා 2011 වර්ෂයේදී ව්‍යාපෘති වාර්ථා සකස් කිරීමට සැලසුම් කර ඇති අතර වේල්ස් කුමාර මාවත ව්‍යාපෘති වාර්ථාව 2011 අගෝස්තු අවසානයේ දී අමාත්‍යවරයාට භාරදීමට නියමිතය.

විගණන වාර්තාව	අධිකාරියේ මතය
(ආ) කළමනාකරණ සංස්ථා ලියාපදිංචි සංඛ්‍යාව 130 ක් වුවද වර්ෂය තුළදී පිහිටුවා ඇති කමිටු සංඛ්‍යාව 15 ක් පමණක් වූ යෙන් කලමනාකරණ කමිටු පිහිටුවීමේ ප්‍රගතිය ඉතා මන්දගාමී බව නිරීක්ෂණය විය.	(ආ) ඔප්පු ලබා නොදීම හේතුවෙන් නීත්‍යානුකූල කළමණාකරන සංස්ථා පිහිටුවීමට නොහැකි අවස්ථා වලදී එම සභාධිපත්‍ය තාවකාලික කළමණාකරන කමිටු පිහිටුවීමට කටයුතු කරනු ලබයි . එහෙත් එම තත්වය කලමණාකරන සංස්ථා පිහිටුවීමේ ප්‍රමාණය සමග සංසන්දනාත්මකව බැලීමේ හැකියාවක් නොමැත. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේ දී කළමනාකරන සංස්ථා 176 ප්‍රමාණයක් පිහිටුවීමට හැකිවිය.

(ඇ) සමාලෝචිත වසර තුලදී සිය ඉලක්ක ප්‍රමාණවත් පරිදි ඉටු කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වියි විස්තර පහත සඳහන් පරිදි වේ.

විෂය	ඉලක්ක ගත		කාර්යය සාධන	ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රගතිය
	සංයුක්ත සැලැස්ම අනුව	ක්‍රියාකාරී සැලැස්ම අනුව	සත්‍ය	ප්‍රතිශතය
කළමණාකරණ සංස්ථා පිහිටුවීම ලියාපදිංචිය	290	260	150	50%
කළමණාකරණ සංස්ථා ලියාපදිංචිය අළුත් කිරීම	-	30	15	50%
සභාධිපත්‍ය නියාමන සමතකරන හා මෙහෙයුම් කටයුතු	200	180	67	37%
සභාධිපත්‍ය සහතික නිකුත් කිරීම	90	89	66	74%

(ඇ) මෙම කරුණ සම්බන්ධ විගණන වාර්ථාවේ පෙන්වා ඇති කරුණු මෙසේ සංශෝධනය විය යුතුය.

	සංයුක්ත සැලැස්ම අනුව	ක්‍රියාකාරී සැලැස්ම අනුව	සත්‍ය	ප්‍රතිශතය
කළමණාකරණ සංස්ථා පිහිටුවීම ලියාපදිංචිය	120	-	53	-
කළමණාකරණ සංස්ථා ලියාපදිංචිය අළුත් කිරීම	170	-	94	-
සභාධිපත්‍ය නියාමන සමතකරන හා මෙහෙයුම් කටයුතු	200	-	-	-
සභාධිපත්‍ය සහතික නිකුත් කිරීම	90	89	-	-

විගණන වාර්තාව	අධිකාරියේ මතය
3.2.2 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම්	**3.2.2 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම්**
සංයුක්ත සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූවෙන් සංයුක්ත සැලැස්මේ ඇති ඉලක්කයන් ලගාකර ගැනීම සඳහා වූ කෙටි කාලීන සැලැස්මක් ලෙස ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කරගන ඇති බවට විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය. ඉලක්කයන් ඉටු කර ගැනීමේ තත්වයන් කාලීනව සමාලෝචනය කිරීමේ ඵලදායී ක්‍රම වේදයක් ආයතනය තුළ නොතිබුණි . මේ අනුව ඉලක්ක ඉටු කර ගැනීමේ ප්‍රගතිය කාලීනව සමාලෝචනය කර දුර්වලතාවයන් හඳුනා ගෙන ඊට නිසි පිළියම් යෙදීමට ඇති හැකියාව කෙරෙහි කළමනාකරණය නිසි අවධානය යොමු කර නොතිබුණි .මේ තත්වය ආයතනයේ දුර්වල මූල්‍ය තත්වය සහ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සෘජුවම බලපා තිබුණි.	සංයුක්ත සැළැස්ම සකස් කිරීමේදි කළමනාකරණ සංස්ථා සහ කළමනාකරණ කමිටු එකම වර්ෂයක් යටතේ 290ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී විෂයන් දෙකක් යටතේ එනම් කළමනාකරණ සංස්ථා 260 ක් සහ කළමනාකරණ කමිටු 30 ක් වශයෙන් වෙන් වෙන්ව පෙන්නුම් කර ඇත. මාසිකව හා ත්‍රෛයිමාසිකව සමාලෝචනය කිරීමේදී වාර්ථා සකස් කරමින් ඒවා සමාලෝචනය කිරීමේ ක්‍රමවේදයක් දිගින් දිගටම පැවතුනි එහෙත් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ආරම්භයේදී සිටම ප්‍රධාන ගැටලු දෙකක් හදුනාගන්නා ලදි. 1 මහල් නිවාස ක්‍රම බොහෝමයක් මේ වන විට වසර 30 ක පමණ කාලයක් කුලී පදනම මත ලබාදීම හේතුවෙන් ඒවායේ නිසි කළමනාකරණයක් අලුත්වැඩියාවක් සිදු නොවීම නිසා මහා පරිමාන අලුත්වැඩියාවන් කළයුතු තත්වයට පත්වී ඇති බව 2 ඉඩම් නිරවුල් නොවීම නිසා ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීමට නොහැකි වීම මත මහල් නිවාස ක්‍රම රාශියක් සහාධිපත්‍ය ගොඩනැගිලි ලෙස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කිරීමට නොහැකි වී ඇති බව මෙම හේතූන් නිසා කළමනාකරණ සංස්ථා පිහිටුවීමේ ඉලක්ක සාර්ථක කර ගැනීමට වහාම විසඳුම් සෙවිය යුතුව තිබුණි. ඒ අනුව දිගින් දිගටම කරුණු දැක්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2011 වාර්ෂික අයවැය ලේඛණය මගින් ඉහත 1 කරුණට අදාල අලුත්වැඩියාවන් සඳහා රු මිලියන 1,000 ක් වෙන් කර දී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් කළමනාකරණ සංස්ථා පිහිටුවීමේ ප්‍රවර්ධනයක් මේ වන විට දක්නට ලැබෙමින් පවතී. එමෙන්ම 2 වන කරුණට අදාලව මෙම අධිකාරිය මැදිහත් වීමෙන් ජාතික ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් තුමා සහ නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්චා කරමින් පවතී.
3.2.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු	**3.2.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**
2006 අංක 38 දරන බදු පනතේ III (අ) වගන්තියට අනුව අධිකාරිය සිය කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වසරට අදාලව රු 92,825 ක උපයන විට බදු නිළධාරින්ගෙන් අයකරනු වෙනුවට අධිකාරිය විසින් ගෙවා තිබුණි.	මෙම ගෙවීම් සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත එහෙත් 2011 අප්‍රෙල් මස සිට මෙම ගෙවීම් අදාල සේවකයාගේ වැටුපෙන් අයකර ගෙවීම සඳහා දැනටමත් කටයුතු කරනු ලබයි.

විගණන වාර්තාව	අධිකාරියේ මතය
3.2.4 කොන්ත්‍රාත් පරිපාලනය	3.2.4 කොන්ත්‍රාත් පරිපාලනය
කොන්ත්‍රාත් සඳහා ලංසු කැඳවීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (අ) ඡේදයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර අධිකාරිය විසින් රු 7,763,910 ක් වූ කොන්ත්‍රාත් 37 ක් වෙනුවෙන් එකම කොන්ත්‍රාත්කරුවන් පිරිසකට ලිපි යැවීම මගින් ලංසු කැඳවීම සිදුකර තිබුණි ප්‍රසම්පාදන කාර්ය ප්‍රසිද්ධියට පත් නොකිරීම නිසා සෑම කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන්ම එක් ලංසුකරුවෙක් පමණක් ඉදිරිපත් වී තිබුණු අතර නිතරගයෙන් එම කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි.	සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විකල්ප ආදායම් ලෙස බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ මන්ත්‍රීවරුනගේ විමධ්‍යගත අරමුදල් මගින් ලබා දෙන ප්‍රතිපාදන වලට අදාල සුලු කොන්ත්‍රාත් ඉටුකර සේවා ගාස්තු ආදායමක් උපයාගනු ලබයි . මෙම කොන්ත්‍රාත් බොහෝවිට නාගරික වතු ජනාවාස වල කාණු පද්ධති සහ වැසිකිලි පද්ධති මූලික කර ගනිමින් ඉටු කරනු ලබන කොන්ත්‍රාත් වේ. එවැනි කොන්ත්‍රාත් සඳහා ඉදිරිපත් වන්නේ කුඩා පරිමාණ කොන්ත්‍රාත් කරුවන් සීමා සහිත ප්‍රමාණයකි. මේ නිසා පුවත්පත් දැන්වීම් මගින් වාර්ෂිකව ලියාපදිංචි කරනු ලබන කොන්ත්‍රාත්කරුවන් මගින් අදාල කොන්ත්‍රාත් ඉටු කර ගනු ලබයි. 2010 වර්ෂයේ එසේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් ගණන 05කි ඒ අනුව මෙම කොන්ත්‍රාත් ඉටුකර ගැනීමට සිදු වූයේ ඔවුන් මගිනි. කෙසේ වුවත් 2011 වර්ෂයේ සිට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (අ) ඡේදය පරිදි කොන්ත්‍රාත් සඳහා පුවත්පත් දැන්වීම් මගින් ලංසු කැඳවනු ලබයි.
4 පද්ධති හා පාලන	
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ. (අ) කොන්ත්‍රාත් පරිපාලනය (ආ) සභාධිපත්‍ය සහතික නිකුත් කිරීම (ඇ) අතිකාල දීමනා ගෙවීම (ඉ) අත්තිකාරම් ගෙවීම (ඊ) කුවිතාන්සි පොත් පවත්වා ගැනීම	2011 වර්ෂයේ දී පද්ධති හා පාලනය සම්බන්ධව (අ) සිට (ඊ) දක්වා පෙන්වා දී ඇති කරුණ සම්බන්ධව විශේෂ අවධානය යොමු කිරීමට කටයුතු කරනු ලබයි.

ඒ ඒ එස් සමරවීර
විගණකාධිපති

වාර්ෂික වාර්තාව
2010

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

1 වන මහල , ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල
සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත
කොළඹ 02
දු.ක : 2 447429/2 447432 ෆැක්ස් : 2 423606 ඊ මේල් : cmastaff@sltnet.lk